**ශීර්ෂය 220 - ආයුර්වේද දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

--------------------------------------------------------------------------------------------------------

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශනය ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුමෙන් හා සැසඳුම් ප්‍රකාශනයෙන් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සාමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

**1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම**

--------------------------------------------------------------------------------------------------------

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවැරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට ආදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.3 විගණන විෂය පථය**

------------------------

ශීර්ෂය 220 - ආයුර්වේද දෙපාර්තමේන්තුවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 සැප්තැම්බර් 25 දින දෙපාර්තමේන්තුවේ කොමසාරිස් වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයුර්වේද දෙපාර්තමේන්තුවේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.17 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටු කිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටුකර තිබුණු බව නිරීක්ෂණය විය.

| මුදල් රෙගුලාසි 128 (1) ප්‍රකාර ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය | | ගණන්දීමේ නිලධාරීගේ එම විධිවිධානයට අනුගත වී නොතිබීම | නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි | | | |
| 128(1)(අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසාදීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණභාවයෙන් යුක්තව සැලැසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ/හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට පරිශ්‍රමයක් දක්වා තිබීම | 1. ක්‍රියාකාරී සැලැස්ම නිවැරදි ලෙස පිළියෙල කර නොතිබීම | 2.1.1 |
| | | 2. ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාණවත් පරිදි සැලැසුම් නොකිරීම | 2.3.1 |
| | | 3. අයවැය ඇස්තමේන්තු තාත්ත්වික ලෙස පිළියෙල නොකිරීම | 2.9 |
| | | 4. අග්‍රිම ඇස්තමේන්තු පිළියෙල කිරීමේ අඩුපාඩු | 2.11 |
| | | 5. ලේඛන හා පොත් පවත්වා නොතිබීම | 2.13 |
| | | 6. අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම | 2.1.2(ආ) |
| | | 7. ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම | 2.1.2 (ඇ) |
| | | 8. මුදල් නිදහස් කර තිබුණත්, ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති | 2.1.2 (ඇ) |

| | | | |
|---|---|---|---|
| | | 9. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු | 2.3.2 |
| | | 10. වත්කම්වල වටිනාකම හා ගුණාත්මකභාවය අඩුවීම | 2.4(අ) |
| 128(1)(ආ) | තම දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය හා ගිණුම්කරණය සඳහා සංවිධානය සාර්ථක බවට සහ අවශ්‍ය අවස්ථාවලදී රජයට ලැබිය යුතු ගාස්තු නිවැරදිව නිශ්චය කිරීමට ඒවා ක්‍රමානුකූලවද, සම්පූර්ණයෙන්ම ද අප්‍රමාදව ද එකතු කර ගැනීමට සහ ලැබෙන මුදල් ගිණුම්ගත කිරීමටද, රජය වෙනුවෙන් වගකීම්වලට බැඳීම් සඳහා බලය දීමටද ඉටුකරන ලද සේවාවන් සැපයීම් අධීක්ෂණය හා පරීක්ෂා කිරීමට සහ එම රජයේ අරමුදලින් ඒ සඳහා අප්‍රමාදව හා නිවැරදිව ගෙවීම් කිරීමට ඉන් ප්‍රමාණවත් තරම් විධිවිධාන සලසා තිබීම | 1. අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම | 2.1.2(ආ) |
| | | 2. ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම | 2.1.2 (ඇ) |
| | | 3. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු | 2.3.2 |
| | | 4. මහජනයා සඳහා සේවා ඉටු කිරීමේ අඩුපාඩු | 2.8 |
| | | 5. අභ්‍යන්තර විගණනයේ වූ අඩුපාඩු | 2.15 |
| 128(1)(ඇ) | මුදල් රෙගුලාසි හා රජයේ වෙනත් පරිපූරක නියමයන් තම දෙපාර්තමේන්තුවේදී පිළිපදිනු ලබන බවට හා අවශ්‍ය අවස්ථාවලදී ඒවාට අතිරේක වශයෙන් දෙපාර්තමේන්තු නියමයන් නිකුත් කරන බව | 1. ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම | 2.13 |
| | | 2. අනුකූල නොවීම් | 2.14 |
| 128(1)(ඈ) | ලැබීම්, ගෙවීම් හා නිකුත් කිරීම් සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර සෝදිසි ක්‍රමයක් පවත්වා ගෙන යන බවට හා ඒ ක්‍රමයේ ක්‍රියාකාරීත්වය කලින් කල සෝදිසි කරන බව | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ සඳහන් අඩුපාඩු | 2.10 |
| 128(1)(ඉ) | රජය සතු වූ හෝ රජය භාරයේ පවත්නා මුදල් බඩුබාහිරදිය, උපකරණ හා වෙනත් වත්කම් | 1. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයන් කිරීමේ අඩුපාඩු | 2.4(ඇ) |

| | | | |
|---|---|---|---|
| | සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් විධිවිධාන යොදවනු ලබන බව, ඒවා වරින්වර සතොයක්ෂණය කරනු ලබන බව, ඒවා නිසියාකාරව නිෂ්කාශණය කරනු ලබන කල්හි එසේ නිෂ්කාශණය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස්වලට අනුකූලව කරනු ලබන බව | 2. වත්කම් කළමනාකරණයේ අඩුපාඩු | 2.4 |
| 128(1)(ඊ) | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා හෝ භාණ්ඩාගාරය හෝ විසින් ඉල්ලා සිටින තොරතුරු, ප්‍රකාශ හා වාර්තා නිවැරදිව කලට වේලාවට ඉදිරිපත් කරන බව | 1. ක්‍රියාකාරී සැලැස්ම නිවැරදි ලෙස පිළියෙල කර නොතිබීම | 2.1.1 |
| | | 2. ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාණවත් පරිදි සැලැසුම් නොකිරීම | 2.3.1 |
| | | 3. අයවැය ඇස්තමේන්තු තාත්ත්වික ලෙස පිළියෙල නොකිරීම | 2.9 |
| | | 4. අග්‍රිම ඇස්තමේන්තු පිළියෙල කිරීමේ අඩුපාඩු | 2.11 |
| | | 5. වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල නොකිරීම | 2.1.3 |
| 128(1)(උ) | රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම පිළිබඳ ප්‍රගතිය දැක්වෙන වාර්තා නිතිපතා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට යවන බව | 1. රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම සම්බන්ධයෙන් | 2.10 |
| | | 2. රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ හිඟහිටි ණය ශේෂ අයකර ගැනීම සම්බන්ධයෙන් | 2.10 |

| | | | |
|---|---|---|---|
| 128(1)(එ) | රජයේ කටයුතු ඉටු කිරීමේදී අපේක්ෂිත අරපිරිමැස්ම, කාර්යක්ෂමතාව, විධිමත්බව හා අවංකභාවය යන කරුණු පිළිබඳ නිසි සැලැකිල්ලෙන් යුක්තව තම දෙපාර්තමේන්තුවේ කටයුතු කරගෙන යන බව | 1. අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම | 2.1.2 (ආ) |
| | | 2. ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම | 2.1.2 (ඇ) |
| | | 3. මුදල් නිදහස් කර තිබුණත්, ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති | 2.1.2 (ඈ) |
| 128(1)(ග) | ඇප තැබීමට බැඳී සිටින නිලධාරීන් එවකට වලංගු නීතිය හා නියමයන් අනුව ඇප තබන බව | අදාළ නිලධාරීන්ගෙන් ඇප ලබා ගැනීමේ අඩුපාඩු | 2.17 |
| 128(1)(ජ) | නිලධාරීන්ගේ/සේවකයින්ගේ ප්‍රමාදය, නොසැලැකිල්ල, වරද හෝ වංචාව නිසා රජයට පාඩු සිදු වී ඇති අවස්ථාවලදී මුදල් රෙගුලාසි 103 සිට 108 දක්වා රෙගුලාසිවල නියම කර ඇති කාර්ය පරිපාටිය ගණන්දීමේ නිලධාරීන් විසින් අනුගමනය කරනු ලබන බවටද, මුදල් රෙගුලාසි 156(1) අනුව එම පාඩු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්/සේවකයන් මත අධිභාර පනවනු ලබන බව | මුදල් සම්බන්ධව කටයුතු කරන නිලධාරීන්ගෙන් ඇප තැන්පත් ලබා නොගැනීම. | 2.17 |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

----------------------------------------------------

### 2.1 කාර්යසාධනය

-----------------

### 2.1.1 සැලැසුම් කිරීම

------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව 2017 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණු අතර, පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම (Action Plan) සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) සමාලෝචිත වර්ෂයට අදාළ වාර්ෂික අයවැය පදනම් කර ගත් ප්‍රමුඛතා අනුව නිසි පරිදි පිළියෙල කළ ක්‍රියාකාරකම් සැලැස්ම (Activity Plan), ක්‍රියාත්මක කාල රාමුව (Time

Line) හා එම ක්‍රියාකාරකම්වල අපේක්ෂිත නිමවුම/ප්‍රතිඵල (Output/ Outcome) ඇතුළත් කර නොතිබුණි.

(ii) දෙපාර්තමේන්තුව යටතේ ඇති එක් එක් අංශ, උප ආයතන, රෝහල් හා ඔසු උයන්වල අවශ්‍යතා පදනම් කරගත් ක්‍රියාකාරකම් නිවැරදිව හඳුනාගෙන නොතිබුණි.

(iii) ප්‍රදේශයේ කාලගුණය, දේශගුණය හා ඔසු වගාවට අදාළ අනෙකුත් සාධක පිළිබඳ වෙන් වෙන්ව අවධානය යොමු කර ඒ ඒ ඔසු උයන සඳහා නිශ්චිත ක්‍රියාකාරකම් හඳුනාගෙන නොතිබුණි.

(ආ) දෙපාර්තමේන්තුව යටතේ ඇති සියළුම අංශවල, උප ආයතනවල සහ රෝහල් හා ඔසු උයන්වලට අදාළ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය ඇගයීම සඳහා කාර්යසාධන දර්ශක පිහිටුවා නොතිබුණු අතර ක්‍රියාකාරකම්වල ප්‍රගතිය සමාලෝචනය කර නොතිබුණි.

**2.1.2 කාර්යභාරයන් ඉටු නොකිරීම**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යභාරයන් ඉටු නොකිරීම**

------------------------------------------------------------------

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව, ඒකාබද්ධ අරමුදලින් රු.මිලියන 819.8 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණු ප්‍රධාන ක්‍රියාකාරකම් 80 ක් සමාලෝචිත වර්ෂය තුළ ඉටු කළ යුතුව තිබුණි. විගණනය සඳහා ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව ඉන් ක්‍රියාකාරකම් 14 ක කටයුතු පමණක් සම්පූර්ණයෙන් අවසන් කර තිබුණද, ප්‍රගති වාර්තා පිළියෙල කර නොතිබීම හේතුවෙන් ඒවායේ මූල්‍ය ප්‍රගතිය හඳුනාගත නොහැකි විය. විගණනය සඳහා ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, රු.මිලියන 304 ක ප්‍රතිපාදන සලසා ඇති ප්‍රධාන ක්‍රියාකාරකම් 07 ක් හා සලසා ගත් ප්‍රතිපාදන හඳුනාගත නොහැකි වූ ප්‍රධාන ක්‍රියාකාරකම් 07 ක්, ඉදිකිරීමට යෝජිත ඉඩම් පවරා ගැනීමේ කටයුතු ප්‍රමාදවීම, මූලිකව පිළියෙල කළ සැලසුම් සංශෝධනය කිරීමට සිදුවී තිබීම හා ප්‍රසම්පාදනයන් සැලසුම් කළ පරිදි සම්පූර්ණ කර නොතිබීම යනාදී හේතූන් මත සමාලෝචිත වර්ෂය තුළදී ආරම්භ කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

**(ආ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

--------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් වූ ක්‍රියාකාරකම්16 ක් සඳහා විස්තරාත්මක දත්ත නොතිබීම හේතුවෙන් ඒවා වෙනුවෙන් සලසා ගත් ප්‍රතිපාදනය හඳුනාගත නොහැකි විය. එසේම ප්‍රගති වාර්තා පිළියෙල කර නොතිබීම හේතුවෙන් මූල්‍ය ප්‍රගතියද නිශ්චිතව හඳුනාගත නොහැකි විය. එසේම එම ක්‍රියාකාරකම් 2017 දෙසැම්බර් 31 දිනට අපේක්ෂිත නිමවුම් මට්ටම අත්පත් කර ගෙනද නොතිබුණි.

(ii) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව, සලසා ගත් ප්‍රතිපාදනය රු.මිලියන 232 ක් වූ ක්‍රියාකාරකම් 07 ක ප්‍රගති වාර්තා පිළියෙල කර නොතිබීම හේතුවෙන් මූල්‍ය ප්‍රගතිය නිශ්චිතව හඳුනාගත නොහැකිව තිබුණු අතර 2017 දෙසැම්බර් 31 දිනට අපේක්ෂිත නිමවුම් මට්ටම අත්පත් කර ගෙනද නොතිබුණි.

(iii) ක්‍රියාකාරී සැලැස්මට අනුව, ඒකාබද්ධ අරමුදලින් රු.මිලියන 103.175 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණු ප්‍රධාන ක්‍රියාකාරකම් 29 ක් සම්බන්ධයෙන් ප්‍රගති වාර්තා පිළියෙල කර නොතිබීම හේතුවෙන් එම ක්‍රියාකාරකම්වල මූල්‍ය හා භෞතික ප්‍රගතිය හඳුනාගත නොහැකි විය.

**(ඈ) ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම**

ඔසු වගා ව්‍යාපෘති 02ක් වෙනුවෙන් සලසාගෙන තිබූ රු.මිලියන 20ක ප්‍රතිපාදන වලින් 2017 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 3.899 ක් වැය කර තිබුණද ඔසු වගාවට අදාළ ඉඩම් හඳුනා නොගැනීම හා ඉඩම් විධිමත් පරිදි පවරා නොගැනීම හේතුවෙන් එම ව්‍යාපෘති අතහැර දමා තිබුණි.

**(ඇ) මුදල් නිදහස් කර තිබුණත් භෞතික ප්‍රගතියක් ලබා තිබුණු බව තහවුරු නොවූ ව්‍යාපෘති**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය තුළදී ඉදිකිරීම් 12 ක් සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත වෙන්කරන ලද ප්‍රතිපාදන රු.මිලියන 46.66 කින් 2017 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 36.46 ක් ඉතිරිවී තිබුණි. ඒ අනුව මූල්‍ය ප්‍රගතිය සියයට 22 ක් වුවද භෞතික ප්‍රගතිය විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ii) සමාලෝචිත වර්ෂය තුළදී දිස්ත්‍රික් ලේකම් කාර්යාල 17 ක් වෙත කාර්යයන් 34 ක් ඉටුකර ගැනීම සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදන රු.මිලියන70.94 කින් 2017 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 44.71 ක් වූ ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. ඒ අනුව මූල්‍ය ප්‍රගතිය සියයට 37 ක් වූ අතර භෞතික ප්‍රගතිය පිළිබඳව තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

**(ඉ) ප්‍රමාණවත් පරිදි ඉටු නොකරන ලද කාර්යයන්**

සමාලෝචිත වර්ෂය තුළදී විවිධ රාජ්‍ය ආයතන 34 ක් විසින් සිදු කරන ලද ඉල්ලීම් පදනම් කර ගෙන දේශීය පාන වර්ග ප්‍රචලිත කිරීමේ වැඩ සටහන යටතේ රු.645,133 ක් වැය කර නොමිලේ කොළ කැඳ හා දේශීය පාන වර්ග බෙදාහැරීමට කටයුතු කර තිබුණද, වැඩ සටහන තවදුරටත් ව්‍යාප්ත කරමින් දේශීය පාන වර්ග ප්‍රචලිත කිරීමට සුදුසු වැඩ පිළිවෙලක් හඳුනාගෙන ක්‍රියාත්මක කර නොතිබුණි.

### 2.1.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව, ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2018 ජූලි 20 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

### 2.2 ක්‍රියාත්මක කර තිබුණු දේශීය ආධාර ව්‍යාපෘති

ශ්‍රී ලංකාවේ දේශීය වෛද්‍ය ක්‍රම මත පදනම් වූ ඖෂධ නිෂ්පාදන කාර්මාන්තය සඳහා ප්‍රමිතිගත අමුද්‍රව්‍ය සපයාගැනීමේ අභිප්‍රායෙන්, ගොවි සහභාගීත්ව ඔසු වගා ව්‍යාපෘතියක් සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක

කිරීම සඳහා දේශීය අරමුදල්වලින් රු.මිලියන 20 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු.මිලියන 3.731ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.මිලියන 16.269 ක් හෙවත් සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 81 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) තෝරාගත් දිස්ත්‍රික්ක 5 ක රජය සතු ඉඩම් හා මූල්‍ය ප්‍රතිපාදන ලබාදී ගොවීන් 2,000 ක් මඟින් ඖෂධීය ශාක වගාකිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණද, දිස්ත්‍රික්ක 3 ක ගොවීන් 96 දෙනෙකු හඳුනාගෙන පමණක් තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී ඔසු උයන් 6 ක් තුළ සහතික කරන ලද ප්‍රමිති බීජ හා රෝපණ ද්‍රව්‍ය පිළියෙල කර ගොවීන් වෙත සැපයීම, වගාබිම් සකස් කිරීමට සහ අමුද්‍රව්‍ය හා ඇට වර්ග මිලදී ගැනීම සඳහා අරමුදල් නිදහස් කිරීම යන කාර්යයන් ව්‍යාපෘති යෝජනවට ඇතුළත් කර තිබුණු නමුත් එම යෝජනා ඉටුකර ගැනීමට විධිමත් සැලැසුම් පිළියෙල කර නොතිබුණු අතර යෝජනා ක්‍රියාත්මක කරද නොතිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුවේ නියාමනය මත තීරුබදු සහන යටතේ 2015, 2016 හා 2017 වර්ෂවලදී ආනයනය කරන ලද අමුද්‍රව්‍ය සඳහා දළ වශයෙන් එකතුව රු.මිලියන 2,660 ක් වැයකර තිබුණු බැවින් අමුද්‍රව්‍ය සඳහා පිටතට ඇදී යන විදේශ විනිමය රට තුළ ඉතිරිකර ගැනීම හා ප්‍රමිතියෙන් උසස් ඖෂධීය අමුද්‍රව්‍ය ලබා ගැනීමේ අපේක්ෂාවෙන් ආරම්භ කළ ව්‍යාපෘතියේ ප්‍රතිපාදනවලින් අපේක්ෂිත අරමුණු ඉටුකර නොගැනීම හේතුවෙන් 2018 වර්ෂය සඳහා මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් ප්‍රතිපාදන සලසා නොතිබුණි.

## 2.3 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් හා සේවා ලබා ගැනීම

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කරමින් සැපයීම් හා සේවා ලබා ගැනීමට රු.මිලියන 1,065.61 ක ප්‍රතිපාදන දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු අතර ඉන් රු.මිලියන 613.53 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. විස්තර පහතින් දැක්වේ.

| වැය විෂය | වැය විෂය විස්තරය | සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය |
|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| | **සැපයීම්** | | | |
| 1201 | ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා | 3.600 | 3.425 | 0.174 |
| 1203 | ආහාර පාන හා නිල ඇඳුම් | 38.325 | 37.089 | 1.236 |
| 1204 | වෛද්‍ය සැපයීම් | 98.000 | 73.348 | 24.652 |
| 1205 | වෙනත් | 12.099 | 11.994 | 0.105 |
| | **මූලධන වත්කම් අත්පත් කර ගැනීම** | | | |
| 2102 | ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | 14.232 | 11.623 | 2.609 |
| 2103 | යන්ත්‍ර හා යන්ත්‍ර උපකරණ | 12.045 | 4.712 | 7.333 |

| | | | | |
|---|---|---|---|---|
| 2104 | ගොඩනැගිලි ඉදිකිරීම | 882.310 | 467.788 | 414.522 |
| 2105 | ඉඩම් හා ඉඩම් වැඩි දියුණු කිරීම් | 5.000 | 3.553 | 1.447 |
| | | --------------- | ------------- | ------------- |
| | එකතුව | 1,065.611 | 613.532 | 453.079 |
| | | ========= | ======== | ======= |

**2.3.1 ප්‍රසම්පාදනයන් සැලැසුම් කිරීම**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) **ප්‍රසම්පාදන සැලැසුම් කිරීම සහ ප්‍රාරම්භක අවධිය**

-----------------------------------------------------

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 මාර්ගෝපදේශය ප්‍රකාරව, දෙපාර්තමේන්තුව විසින් අවම වශයෙන් වර්ෂ 3 ක කාලයක් සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**(ආ) පූර්ව කොන්ත්‍රාත් අදියරය**

----------------------------

(i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 මාර්ගෝපදේශය ප්‍රකාරව, යම් ප්‍රසම්පාදනයක් ආරම්භයේ සිට අවසන් කරනතුරු එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවන්හි පියවර කාලානුගතව විස්තර කරන ප්‍රසම්පාදන කාල සටහනක් පිළියෙල කළ යුතු වුවද, පිළියෙල කර තිබුණු ප්‍රසම්පාදන කාල සටහනේ එක් එක් ප්‍රසම්පාදන කාර්යය නිශ්චිතව හඳුනාගෙන නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණු ප්‍රසම්පාදන සැලැස්මට ආයුර්වේද රෝහල් සඳහා මිලදී ගනු ලබන අමු හා වියලි ඖෂධ හා ඔසු උයන්වල සැළසුම් කරන ලද ඉදිකිරීම් ඇතුළත් කර නොතිබුණි.

**2.3.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම**

------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) සම්ප්‍රදායික වෛද්‍ය ක්‍රම හා අනුපූරක ඖෂධ පිළිබඳ අන්තර් ජාතික සම්මන්ත්‍රණය හා වෙළඳ ප්‍රදර්ශනය (Trad Med International Symposium Exhibition) – 2017**

-------------------------------------------------------------------------------------------

සම්ප්‍රදායික වෛද්‍ය ක්‍රම හා අනුපූරක ඖෂධ පිළිබඳ අන්තර් ජාතික සම්මන්ත්‍රණය හා වෙළඳ ප්‍රදර්ශනය 2017 නොවැම්බර් 23, 24 හා 25 තෙදින තුළ පැවැත්වීම සඳහා 2017 ඔක්තෝබර් මාසයේදී අමාත්‍යාංශයෙන් ලැබුණු රු.මිලියන 40 ක ප්‍රතිපාදනයෙන් රු.මිලියන 39.41 ක් වැය කර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) මේ සම්බන්ධයෙන් ගෙන තිබුණු අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, විදේශීය ව්‍යාපාරික ආයතන සම්බන්ධීකරණය වෙනුවෙන් ඉන්දියානු ලංසුකරුට එක් වෙළඳ කුටියක ආදායමෙන් සියයට 25 ක කොමිස් මුදලක් ගෙවීමට, අන්තර් ජාතික ප්‍රචාරණ කටයුතු ආරම්භ කිරීම සඳහා ඇමෙරිකානු ඩොලර් 3,000 ක් ගෙවීමට හා පර්යේෂණ උද්‍ධෘතයක් එක්සත් රාජධානියේ Bio Medical Central සඟරාවේ පළ කිරීම සඳහා එම සමාගමට

ස්ටාර්ලින් පවුම් 3,060 ක් ගෙවීමට කටයුතු කළ බවට හෝ ඒ සම්බන්ධයෙන් ගිවිසුම්වලට එළඹි බවට හෝ තොරතුරු කිසිවක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි

(ii) ප්‍රදර්ශනයෙන් අපේක්ෂිත ආදායම වූ රු.මිලියන 12.5 ක් ලද බව තහවුරු කෙරෙන තොරතුරු කිසිවක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(iii) ප්‍රදර්ශනයට අදාළ සේවා සැපයීම් ලබාගැනීම සඳහා අයිතම දහයක් යටතේ පිළියෙල කර තිබුණු ලංසු ආරාධනාව පුවත් පත්වල පළ කළ බව තහවුරු කිරීමේ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(iv) සේවා දහයක් සපයා ගැනීම සඳහා තෝරාගත් සැපයුම්කරුවන් වෙත කොන්ත්‍රාත් වටිනාකම සඳහන් නොකර සේවා ප්‍රදාන ලිපි නිකුත් කර තිබුණි.

(v) මෙම සම්මන්ත්‍රණය හා වෙළඳ ප්‍රදර්ශනය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 39.41 ක් දෙපාර්තමේන්තුව විසින් වැයකර තිබුණ අතර ඉන් රු.මිලියන 38.02 කට අදාළ ප්‍රසම්පාදනයන් සම්බන්ධයෙන් ලංසු ලියවිලි (Bid Document), කොන්ත්‍රාත් කොන්දේසි (conditions of contract), ඉදිරිපත් වූ ලංසු ප්‍රමාණය, ලැබුණු ලංසු, ලංසු විවෘත කිරීමේ වාර්තා, ප්‍රසම්පාදන හා තාක්ෂණ ඇගැයීම් කමිටු වාර්තා, කොන්ත්‍රාත් වටිනාකම්, සැපයුම්කරුවන් සමග එළැඹි ගිවිසුම්, ලංසු සුරක්ෂණ, කාර්යසාධන සුරක්ෂණ, විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**(ආ) සීරුමාරු කළ හැකි ඇඳන් 52 ක් මිලදී ගැනීම**

2018 මාර්තු මාසයේදී රු.4,678,400 ක් වැය කර සීරුමාරු (Adjustable) කළ හැකි මෙට්ට සහිත ඇඳන් 52 ක් මිලදීගෙන තිබුණු අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) මෙට්ට රහිත දැල සහිත ඇඳන් 24 ක් හා මෙට්ට රහිත ලෑලි සහිත ඇඳන් 24 ක් මිලදී ගැනීමට අවශ්‍ය පිරිවිතර පිළියෙල කිරීමෙන් පසු රජයේ කර්මාන්ත ශාලාව වෙතින් ලංසු ගෙන්වා ගෙන තිබුණද එම ලංසුව පිළිබඳව නොසලකා, එම ඇඳන් වෙනුවට සීරුමාරු (Adjustable) ඇඳන් 52 ක්මිලදී ගැනීමට තීරණය කර තිබුණි.

(ii) රජයේ කර්මාන්ත ශාලාව වෙතින් ලංසු කැඳවූයේ කවුරුන් විසින් කරන ලද ඉල්ලීමක් මත කුමන රෝහලක හෝ ආයතනයක අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම සඳහාද යන්න හෝ සාමාන්‍ය ඇඳන් වෙනුවට සීරුමාරු (Adjustable) ඇඳන් 52 ක් මිලදී ගැනීමට තීරණය කිරීමට හේතුවූ කරුණු හෝ විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

(iii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1(ආ) මාර්ගෝපදේශය ප්‍රකාරව තාක්ෂණික ඇගැයීම් කමිටුව, විෂයය පිළිබඳ විශේෂඥයෙකුගෙන් සහ ප්‍රසම්පාදන කාර්යය පරිපාටිය පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් ඇති අවම වශයෙන් එක් සාමාජිකයෙකුගෙන්ද සමන්විත විය යුතු වුවද, විෂයය පිළිබඳ දැනුමක් නොමැති නිලධාරීන් තිදෙනෙකුගෙන් සමන්විත තාක්ෂණික ඇගයීම් කමිටුවක් විසින් මෙම ප්‍රසම්පාදනය ඇගැයීම් කර තිබුණි.

(iv) අමාත්‍යාංශයේ ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශයේ උපදෙස් ලබාගෙන සීරුමාරු (Adjustable) ඇඳන්වල පිරිවිතර පිළියෙල කර නොතිබුණු අතර නිශ්චිත පිරිවිතර ලංසු කැඳවීමේ ලේඛනවල ඇතුළත් කර නොතිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ

සංග්‍රහයේ 2.3.2 (ඇ) මාර්ගෝපදේශය ප්‍රකාරව, පිරිවිතර අනුමත කිරීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(v) අවශ්‍යතා පිරිවිතරය නිශ්චිතව සඳහන් කර නොතිබීම හේතුවෙන් ලංසු ඉදිරිපත් කර තිබුණු ලංසුකරුවන් 04 දෙනා විසින් විවිධ විකල්ප පිරිවිතර සඳහන් කර විකල්ප ලංසු ඉදිරිපත් කර තිබුණි.

(vi) සීරුමාරු ඇඳන් සඳහා පමණක් ලංසු කැඳවා තිබුණු අතර මෙට්ට හෝ ඇඳ ඇතිරිලි සහිත සීරුමාරු ඇඳන් සඳහා පිරිවිතර පිළියෙල කිරීමට හෝ ලංසු කැඳවීමට හෝ කටයුතු කර නොතිබුණි. නමුත් තෝරා ගත් සැපයුම්කරු පමණක් මෙට්ට හා ඇඳ ඇතිරිලි සහිත සීරුමාරු ඇඳන් වර්ග 02 ක් සඳහා ලංසු ඉදිරිපත් කර තිබුණු අතර ඉතිරි ලංසුකරුවන් 03 දෙනා මෙට්ට හෝ ඇඳ ඇතිරිලි රහිත සීරුමාරු ඇඳන් සඳහා පමණක් ලංසු ඉදිරිපත් කර තිබුණි. තෝරා ගත් සැපයුම්කරු වෙතින් මිලදී ගැනීමට තීරණය කර තිබුණු මෙට්ට හා ඇඳ ඇතිරිලි සහිත සීරුමාරු ඇඳන් වර්ග 02 සඳහා ඉතිරි ලංසුකරුවන් 03 දෙනා ලංසු ඉදිරිපත් කර නොතිබුණු බව නොසලකා තාක්ෂණික ඇගැයීම සිදුකර තිබුණි.

(vii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.10.1 (ආ) මාර්ගෝපදේශය ප්‍රකාරව හා මෙම ප්‍රසම්පාදනයට අදාළ ලංසුකරුවන්ට උපදෙස් (ITB) අංක 35.4 ප්‍රකාරව, තෝරාගත් ලංසුකරුගේ පළපුරුද්ද තහවුරු කර ගැනීම සඳහා මෙට්ට හා ඇඳ ඇතිරිලි සහිත සීරුමාරු ඇඳන් වර්ග 02 සැපයීමට අදාළව වර්ෂ 05 ක පළපුරුද්ද හා ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි සහතිකය පරීක්ෂා කිරීමකින් තොරව ලංසු ඇගැයීම සිදුකර තිබුණි.

(viii) මිලදී ගෙන තිබුණු ඇඳන්, සාම්පල්වලට අනුව ඉදිරිපත්කර ඇති බව තහවුරු කර ගෙන නොතිබුණි.

(ix) මිලදී ගෙන තිබුණු ඇඳන් හා මෙට්ට ප්‍රමිතියෙන් බාල බව ආයුර්වේද පර්යේෂණායතනයේ විශේෂඥ වෛද්‍යවරිය විසින් ආයුර්වේද කොමසාරිස්වරයාට 2018 ජනවාරි 17 දින දැනුවත් කර තිබුණු අතර ඉන් පසු මෙට්ට පමණක් නැවත පිළිසකර කර තිබුණි. නමුත් මෙට්ට නිසි පරිදි පිළිසකර කර නොතිබුණු බව තහවුරු විය. වර්ෂ 02 ක වගකීම් කාලය ඉකුත් වීමට පෙර මෙම ඇඳන් හා මෙට්ට නිසි ලෙස ප්‍රතිස්ථාපනය කර ගැනීමට හෝ කාර්යසාධන සුරක්ෂණය මුදල් කර ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

(x) මෙට්ට රහිත දැල සහිත ඇඳන් හා මෙට්ට රහිත ලෑලි සහිත ඇඳන් වර්ග 02 ක සඳහා පිරිවිතර පිළියෙල කිරීමෙන් පසු රජයේ කර්මාන්තශාලාව වෙතින් ලබා ගෙන තිබුණු ලංසුව එක් ඇඳකට පිළිවෙලින් රු.20,300 ක් හා රු.28,360 ක් පමණක් වූ බැවින්ද, ප්‍රසම්පාදනය අවසානයේ තෝරාගත් ලංසුකරුගෙන් මෙට්ට හා ඇඳ ඇතිරිලි රහිත සීරුමාරු ඇඳක් සපයා ගැනීම සඳහා රු.87,200 ක් ගෙවා ඇති බැවින්ද, එසේ මිලදී ගෙන තිබුණු ඇඳන් හා ලංසු කැඳවීමකින් තොරව මිලදී ගෙන තිබුණු මෙට්ට හා ඇඳ ඇතිරිලි ප්‍රමිතියෙන් තොරවීම නිසාද, මෙම ප්‍රසම්පාදනයේ ආර්ථික බව, ඵලදායී බව හා විනිවිධභාවය තහවුරු නොකෙරුණි.

**(ඇ) කයිතඩි ආයුර්වේද රෝහලේ ඖෂධ නිෂ්පාදනාගාරය ඉදිකිරීම**

---

නිර්මාණය කර ගොඩනැගීමේ (Design & Build) ක්‍රමයට කයිතඩි ආයුර්වේද රෝහලේ ඖෂධ නිෂ්පාදනාගාරය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව රු.මිලියන 63.56 ක වැට්බදු රහිත කොන්ත්‍රාත් වටිනාකමක් සහිතව පෞද්ගලික සමාගමක් වෙත 2016 ජූලි 15 දින ප්‍රදානය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.10.1 (අ) මාර්ගෝපදේශය ප්‍රකාරව, නිර්මාණශීලි ප්‍රවේශයන් අවශ්‍යවන ඒකාබද්ධිත විශාල ප්‍රමාණයේ කොන්ත්‍රාත් සඳහා

නිර්මාණය කර ගොඩනැගීමේ (Design & Build) ක්‍රමය අනුගමනය කිරීම සුදුසු වුවද, වර්ග මීටර් 1,415 ක් වැනි කුඩා ඉඩකඩක් සහිත ගොඩනැගිල්ලක් සඳහා එම ක්‍රමය අනුගමනය කර තිබීම හේතුවෙන් වර්ග මීටර් එකක් සඳහා එකතු කළ අගය මත බදු රහිත රු.44,947 ක් වැය කිරීමට සිදුවී තිබුණි.

(ii) නිෂ්පාදනාගාරයකට අත්‍යාවශ්‍ය මූලික අවශ්‍යතා 06 ක් කොන්ත්‍රාත්කරු විසින් පිළියෙල කර තිබුණු ගොඩනැගිලි සැලැස්මට ඇතුළත්වී නොතිබුණු නමුත් ඒ පිළිබඳව නොසලකා නිර්මාණ කටයුතු සඳහා රු.මිලියන1.5 ක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි.

(iii) සැලැසුම් නිසි පරිදි නිර්මාණය කර නොතිබීම හේතුවෙන්, රෝහල් පිවිසුම් මාර්ගය අතිරේක මීටර් 50 ක් ඉදිකිරීමට, ගොඩනැගිල්ලේ ඇතුළත හා පිටතට කේබල් ඇතිරීමට හා roller shutter දොරක් සවිකිරීමට රු.2.91 ක අතිරේක පිරිවැයක් දැරීමට සිදුවී තිබුණි.

(iv) ඖෂධාගාරයේ වහල වර්ග මීටර් 685 ක් ආවරණය කිරීමට රු.667,875 ක් වැයකර ඇස්බැස්ටස් තහඩු යෙදීමට සැලැසුම් කර තිබුණු නමුත් ඒ වෙනුවට ZN/AL Roofing sheet යෙදීමට තීරණය කර තිබීම හේතුවෙන් රු.708,975 ක අතිරේක පිරිවැයක් දැරීමට සිදුවී තිබුණි.

(v) 2018 වර්ෂයේදී අවසාන බිල්පත ගෙවා තිබුණු නමුත් කොන්ත්‍රාත්කරු විසින් නිමකළ ගොඩනැගිල්ල භාරදී තිබීම හෝ දෙපාර්තමේන්තුව විසින් නිවැරදිව භාර ගෙන තිබීම පිළිබඳ සාක්ෂි කිසිවක් විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

**(ඇ) බොරැල්ල ආයුර්වේද රෝහලේ දෙවන අදියරයට අදාළ ගොඩනැගිල්ල ඉදිකිරීම**

බොරැල්ල ආයුර්වේද රෝහලේ දෙවන අදියරයට අදාළ ගොඩනැගිල්ල ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවේ කොන්ත්‍රාත් වටිනාකම රු.මිලියන 1,113.16 ක් වූ අතර 2018 අප්‍රේල් 10 දින වන විට කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණු එකතු කළ අගය මත බදු රහිත මුළු මුදල රු.මිලියන 982.06 ක් විය. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) නිසි ලෙස සැලසුම් පිළියෙල කර නොතිබීම හේතුවෙන්, දැව දොරවල්වල ඝනත්වය පසුව වෙනස් කිරීමට සිදුවීම, සැලසුම්වල ඇතුළත් නොවූ වතුර ටැංකියක් ඉදිකිරීමට සිදුවීම හා ෆල්යිවුඩ් දොරවල් වෙනුවට ඇලුමිණියම් දොරවල් සවිකිරීමට සිදුවීම නිසා රු.මිලියන 18.69 ක අතිරේක පිරිවැයක් දැරීමට සිදුවී තිබුණි.

(ii) ගොඩනැගිල්ලට සවිකිරීම සඳහා මුළු පිරිවැය රු.මිලියන 7.37 ක් වූ රූපවාහිනී යන්ත්‍ර 200 ක් හා වතුර රත්කරන ගීසර් (water gezers) 108 ක් ගොඩනැගිල්ල ඉදිරිකිරීමේ කටයුතු අවසන් කිරීමට පෙර මිලදී ගෙන තිබීම හේතුවෙන්, එම උපකරණ සඳහා වූ වර්ෂ 02 ක වගකීම් කාලයෙන් වර්ෂ 1 මාස 06 කට වඩා වැඩි කාලයක් ගතවීමෙන් පසු උපකරණ සවිකර තිබුණි.

(iii) 2015 වර්ෂයේදී ආරම්භ කර තිබුණු මෙම කොන්ත්‍රාත්තුවේ වටිනාකම රු.මිලියන 1,113.16 ක් වූ නමුත් 2015 සිට 2018 වර්ෂය දක්වා කාලය තුළදී සලසා ගෙන තිබුණු මුළු ප්‍රතිපාදනය රු.මිලියන 1,127.44 ක් පමණක් වූ බැවින්, කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර තිබුණු බිල්පත් සඳහා නියමිත කාලය තුළදී ගෙවීම් කිරීමට අපොහොසත්වී මත කොන්ත්‍රාත්කරු විසින් රු.මිලියන 27.91 ක ප්‍රමාද ගාස්තු සඳහා ඉල්ලීම් කර තිබුණි.

(iv) අවසන් වරට අනුමත කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමේ ලිපිය ප්‍රකාරව, 2018 ජනවාරි 02 දින වන විට ඉදිකිරීම් නිමකළ යුතු වුවද, 2018 ජුලි 31 දින වන විටද වැඩ අවසන් කර ගොඩනැගිල්ල භාරදී නොතිබුණි. කෙසේ වෙතත් ප්‍රධාන ජල ටැංකිය (water sump) හා

පල්දෝරු පද්ධතිය ඉදිකිරීම සැලැසුම්වලට ඇතුළත් කර නොතිබුණු බැවින් ගොඩනැගිල්ල පාවිච්චියට ගත නොහැකි තත්ත්වයක් මතුවී තිබුණි.

**2.4 වත්කම් කළමනාකරණය**

**-----------------------------**

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

**(අ) වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම**

**------------------------------------------------**

බොරැල්ල ආයුර්වේද රෝහල් පරිපාලන කටයුතු සිදු කරන කාර්යාල පරිශ්‍රය, අංක 02 හා අංක 05 දරන පංචකර්ම වාට්ටු දෙකෙහි සහ ගෙවන වාට්ටු දෙක ආවරණය වන පරිදි සවිකර තිබුණු විදුලි ජනක යන්ත්‍රය සවිකිරීමෙන් පසු යන්ත්‍ර පැය 10 ක් පමණක් ක්‍රියාකර තිබුණු බවත් එය 2010 වර්ෂයෙන් පසුව භාවිතාකර නොතිබුණු බවත් අනාවරණය විය.මෙම යන්ත්‍රයේ ආරක්ෂාව සඳහා ප්‍රමාණවත් විධිවිධාන සලසා නොතිබීම හේතුවෙන් යන්ත්‍රයේ අභ්‍යන්තර පද්ධතිය (Panel Board) සතුන් විසින් කා දමා විනාශ කර තිබුණි.

**(ආ) වාහන උපයෝජනය**

**-------------------------**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ විගණනයට ඉදිරිපත් නොකිරීම

-------------------------------------------------------------------------------------

මුදල් රෙගුලාසි 1645 (ආ),(ඇ) සහ මුදල් රෙගුලාසි 1646 ප්‍රකාරව, දෛනික ධාවන සටහන් සහ මාසික සාරාංශ සටහන්වල මුල් පිටපත් සෑම මාසයක් අවසන් වීමෙන් පසු ඊලඟ මාසයේ 15 දිනට පෙර විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවද, දෙපාර්තමේන්තුව සතු වාහන 51 ක දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ii) ලොග් සටහන් පොත් නිසි ලෙස පවත්වා නොතිබීම

---------------------------------------------------------

වාහන පිළිබඳව අදාළ විස්තර ලොග් සටහන් පොත්වල සටහන් කර වාහන භාර නිලධාරියා විසින් අත්සන් කළ යුතු වුවද, නියැදි පරීක්ෂාවට ලක් කළ වාහන 12 ක් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි.

(iii) ඉන්ධන දහනයවීම් පරීක්ෂා නොකිරීම

**---------------------------------------------**

2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව, සෑම ඉන්ධන පරීක්ෂාවකටම මාස 12 කට පසුව හෝ කිලෝ මීටර් 25,000 ක දුර ප්‍රමාණය ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අළුත්වැඩියාවකින් පසුව හෝ යන කාරණා අතරින් පළමුව යෙදෙන අවස්ථාවට පසුව ඉන්ධන දහනය පරීක්ෂා කළ යුතු වුවද, 2011 වර්ෂයෙන් පසුව දෙපාර්තමේන්තුවේ වාහනවල ඉන්ධන දහනය පරීක්ෂාකර නොතිබුණි.

(ඇ) ඌන උපයෝජිත වත්කම්
-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2000 වර්ෂයේදී ආයුර්වේද පර්යේෂණායතනයට ලැබී තිබුණු පිරිවැය රු.මිලියන 14.61 ක් වූ Gas Chromatography Mass Spectometer (GCMS)යන්ත්‍රය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පවත්වාගෙන යන ලේඛනයේ සඳහන් තොරතුරු අනුව, 2012 අගෝස්තු මාසයේ සිට 2018 අගෝස්තු දක්වා වූ වර්ෂ 06 ක කාල පරිච්ඡේදයේදී යන්ත්‍රය අවස්ථා 11 ක් පමණක් පරීක්ෂණ සඳහා පාවිච්චි කර තිබුණි.

(ii) ආයුර්වේද පර්යේෂණායතනය සතු පිරිවැය රු.මිලියන 3.21 ක් වූ ඩෙන්සිටනෝ මීටරය හා එයට සම්බන්ධ පරිගණකය අක්‍රීයවී තිබුණද, එය අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ විධිමත් පරිදි අපහරණය කිරීමට වර්ෂ 08 කට වඩා වැඩි කාලයක් තුළ කටයුතු කර නොතිබුණි.

(ඈ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම
----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.2.6 ඡේදය ප්‍රකාරව, 2017 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2018 ජුනි 15 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, දෙපාර්තමේන්තුව විසින් එම වාර්තා 2018 ජූලි 20 දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. තවද අවසානවරට වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පවත්වා තිබුණේ 2016 වර්ෂය වෙනුවෙනි.

(ii) යථෝක්ත චක්‍රලේඛයේ 3.1.5 ඡේදය ප්‍රකාරව, භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ලැබීමෙන් පසු විනාශ කළ යුතු, අළුත්වැඩියා කළ යුතු, විකිණිය යුතු හා වෙනත් රාජ්‍ය ආයතනවලට පැවරිය හැකි භාණ්ඩ සම්බන්ධව සුදුසු පරිදි කටයුතු කළ යුතුය. එසේම මුදල් රෙගුලාසි 770 ප්‍රකාරව, පාවිච්චි කළ නොහැකි භාණ්ඩ විධිමත් ලෙස අපහරණය කළ යුතු විය. එසේ වුවද, 2016 වර්ෂය වෙනුවෙන් භාණ්ඩ සමීක්ෂණය සිදුකළ සමීක්ෂණ මණ්ඩලය විසින්ම කිසිදු අධිකාරී බලයකින් තොරව අපහරණ මණ්ඩලයක් ලෙස කටයුතු කරමින් දෙපාර්තමේන්තුව යටතේ ඇති ආයතන 16 ක භාණ්ඩ වෙන්දේසි කර තිබුණි.

2.5 බැදීම් හා බැරකම්
--------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 02(අ) ඡේදයට අනුකූල නොවී වැය විෂයයන් 42 ක් සඳහා සලසා තිබුණු රු.මිලියන 1,444.29 ක ප්‍රතිපාදනය රු. මිලියන114.32 කින් ඉක්මවා රු.මිලියන 234.87 ක බැදීම් ඇති කර ගෙන තිබුණි.

(ආ) විසර්ජන ගිණුමේ ඩීජීඑස්ඒ 8 (ii) බැරකම් පිළිබඳ ප්‍රකාශයට අනුව, 2017 දෙසැම්බර් 31 දිනට රු.මිලියන282.85 ක බැරකම් පැවති නමුත් ඉන් රු.245.75 ක් වූ බැරකම් වෙනුවෙන් පමණක් භාණ්ඩාගාර අනුමැතිය ඉල්ලුම් කර තිබුණු අතර එම අනුමැතියද ලැබී නොතිබුණි.

## 2.6 විසඳා නොතිබුණු විගණන ඡේද

දෙපාර්තමේන්තුවට අදාළව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| **වර්ෂය** | **ඡේද අංකය** | |
| 2014 | 5.10 | 2012 ජූලි 13 දින දෙපාර්තමේන්තුවෙන් වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව වෙත ස්ථානමාරුවී ගිය වෛද්‍යවරයෙකුට එතැන් සිට මාස 15 ක් සඳහා රු.548,376 ක වැටුප් ගෙවා තිබුණි. ඉන් රු. 200,000 ක් ආපසු අයකරගෙන තිබුණු නමුත් ඉතිරි රු.348,376 ක් සහ රජයේ ගාස්තු රු.137,094 ක් ඇතුළත් මුළු මුදල රු.485,470 ක් අයකරගෙන නොතිබුණි. |
| 2015 | 3.12 | දෙපාර්තමේන්තුවේ ලොරි රථය 2014 ජුනි 03 දින සිට ජුනි 27 දින දක්වා ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවට ලබාදී තිබුණු නමුත් ඒ වෙනුවෙන් අයකර ගත යුතු කුලිය රු.102,261 ක් 2018 ඔක්තෝබර් මාසය වන විටත් අයකරගෙන නොතිබුණි. |

## 2.7 කළමනාකරණ දුර්වලතා

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනයේ බෝ නොවන රෝග සඳහා ප්‍රතිකාර කළමනාකරණ පද්ධතිය පිළිබඳ පර්යේෂණ වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) බණ්ඩාරනායක අනුස්මරණ පර්යේෂණායතනය විසින්, ඩෙංගු, කොලොස්ටරෝල්, දියවැඩියාව, පිළිකා සහ වකුගඩු රෝග යනාදී බෝ නොවන රෝග සඳහා ප්‍රතිකාර කළමනාකරණ පද්ධතිය පිළිබඳ පර්යේෂණ වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණි. නමුත් ව්‍යාපෘතිය පර්යේෂණ මට්ටමට පමණක් සීමාවී තිබුණි.

(ii) මෙම ව්‍යාපෘතිය සඳහා 2017 දෙසැම්බර් 31 දින වන විට අනුමත ස්ථිර කාර්ය මණ්ඩලය 286 ක් වූ අතර එදිනට ඉන් තනතුරු 163 ක් පුරප්පාඩුවී තිබුණි.

(iii) අනුමත කාර්යය මණ්ඩලය තුළ පවතින අත්‍යාවශ්‍ය තනතුරු සඳහා බඳවා ගැනීම් සිදුනොකර හා අවශ්‍ය විද්‍යාගාර පහසුකම් සම්පූර්ණ නොකර 2013 සිට 2015 දක්වා වූ වර්ෂවලදී රු.මිලියන 164.97 ක් පිරිවැය වූ පර්යේෂණ උපකරණ මිලදී ගෙන තිබුණු අතර එම උපකරණ නිෂ්කාර්යයව තිබියදී, 2016 වර්ෂයේදීද පිරිවැය රු.මිලියන 38.05 වූ පර්යේෂණ උපකරණ මිලදීගෙන තිබුණි. කාර්ය මණ්ඩලය බඳවා නොගැනීම හේතුවෙන්

2018 ජනවාරි 24 දින වන විටත් පිරිවැය රු.මිලියන 65.07 ක් වූ උපකරණ භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. තවද අවශ්‍ය රසායන ද්‍රව්‍ය මිලදී නොගැනීම හේතුවෙන් පිරිවැය රු.මිලියන 1.91 ක් වූ උපකරණයක් පාවිච්චි කළ නොහැකිවී තිබුණි.

(ආ) පර්යේෂණායතනයේ පාරම්පරික දැනුම සංරක්ෂණය හා දේශීය වෙදකම ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) පාරම්පරික දැනුම සංරක්ෂණය හා දේශීය වෙදකම ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් දිවයින පුරා සිටින සෑම පාරම්පරික වෛද්‍යවරයෙකුම සතු දැනුම සංරක්ෂණය කිරීමට හා ඒ සඳහා ශ්‍රව්‍ය දෘශ්‍ය තොරතුරු විශ්ව කේන්ද්‍රයක් ස්ථාපිත කිරීමට බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනය විසින් ඉදිරිපත් කර තිබුණු ව්‍යාපෘතියක් 2015 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබුණු අතර ඒකාබද්ධ අරමුදලින් රු.මිලියන 27.0 ක ප්‍රතිපාදන සලසා තිබුණි. ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය ඒකකය ස්ථාපිත කිරීම සඳහා රු.මිලියන 12.0 ක් පමණක් ප්‍රතිපාදන සලසා තිබියදී, රු.මිලියන 23.56 ක් වැයකර එම ඒකකයට අවශ්‍ය උපකරණ මිලදී ගෙන තිබුණි. එසේ නමුත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම ඒකකයේ කටයුතු කරගෙන යාමට සෘජුවම අවශ්‍ය තනතුරු අනුමත කර බඳවාගෙන නොතිබුණු බැවින් අදාළ උපකරණ නිශ්කාර්යව පැවතුණි.

(ii) ශ්‍රව්‍ය දෘශ්‍ය ඒකකය ලෙස වෘත්තිය මට්ටමේ ඡායාරූපාගාරයක් ඉදිකර තිබුණු අතර ඒ සඳහා දැනුම හා පුහුණුව රහිත ආයුර්වේද වෛද්‍යවරයෙකු එම ඒකකයට අනුයුක්ත කර තිබුණි. ඒ හේතුවෙන් ශ්‍රව්‍ය දෘශ්‍ය ඒකකයෙන් අපේක්ෂිත කාර්යයන් ඉටුවී නොතිබුණු අතරම ආයුර්වේද වෛද්‍යවරයෙකු වශයෙන් ඔහුගෙන් ලබාගත යුතු සේවයද දෙපාර්තමේන්තුවට අහිමිවී තිබුණි.

(iii) ව්‍යාපෘතියේ මූලික අරමුණ වූ පාරම්පරික දැනුම සංරක්ෂණය හා දේශීය වෙදකම ප්‍රවර්ධනය කිරීමට අදාළව සැලසුම් කර තිබුණු වෛද්‍ය ග්‍රන්ථ වෛද්‍ය උපකරණ වෙනත් වෛද්‍ය තොරතුරු සංරක්ෂණය කිරීම, පරම්පරා 10 ක පාරම්පරික ශිෂ්‍යයන් පුහුණු කිරීම, දේශිය පාරම්පරික දැනුම පිළිබඳ බුද්ධිමය දේපල අයිතිය තහවුරු කිරීම, සංරක්ෂණය කරන ලද පොත් 100 ක පිටපත් හා වාර්ෂික සඟරා එළිදැක්වීම හා පාරම්පරික දැනුම සංරක්ෂණය කිරීමේ විශ්ව කේන්ද්‍රය පිහිටුවීම යන කාර්යයන්ගෙන් එක් කාර්යයක් හෝ ඉටුකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(ඇ) මෛත්‍රිපාල සේනානායක අනුස්මරණ පාරම්පරික පර්යේෂණ රෝහල හා කෞතුකාගාරය ඉදිකිරීම

---

මෛත්‍රිපාල සේනානායක අනුස්මරණ පාරම්පරික පර්යේෂණ රෝහල හා කෞතුකාගාරය මිහින්තලේ ඉලුප්පුකන්නි ප්‍රදේශයේ ඉදිකිරීම සඳහා 2008 ජූලි 18 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. මුළු ඉංජිනේරු ඇස්තමේන්තුව රු.මිලියන 586.70 ක් වී තිබුණු අතර එහි පළමු අදියරය රු.මිලියන 39.95 කට ඉදිකර අවසන් කිරීමට 2012 නොවැම්බර් 26 දින ශ්‍රී ලංකා ඉංජිනේරු සංස්ථාව සමග ගිවිසුමකට එළඹ තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) පළමු අදියරයෙන් ඉදිකර තිබුණු ගොඩනැගිල්ල දෙපාර්තමේන්තුව වෙත 2017 මාර්තු 31 දින භාරදී තිබුණද,රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.2 මාර්ගෝපදේශය ප්‍රකාරව, පිරිවිතර හා එකඟවී ඇති වෙනත් නියම සහ කොන්දේසිවලට අනුකූලව වැඩ ඉටුකර ඇති බවට හා සහතික කර ඇති ගෙවීම්, කොන්ත්‍රාත් කොන්දේසිවලට අනුකූල බවට සහතික කරමින් වැඩ අවසන් කිරීමේ සහතිකයක් ඉංජිනේරුවරයා/උපදේශකවරයා විසින් නිකුත් කළ යුතු වුවත් එවැනි වැඩ අවසන් කිරීමේ සහතිකයක් නිකුත් කර නොතිබුණි.එසේම 2018 ජූලි 31 දින වන විටත් මෙම රෝහල රෝගී සත්කාරක සේවා වෙනුවෙන් විවෘත කර නොතිබුණි.

(ii) ඉදිකළ ගොඩනැගිල්ල පිළිබඳව 2017 ජූලි 12 දින සිදු කරන ලද භෞතික විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ පහත සඳහන් අඩුපාඩු 2018 ජුනි 31 දින වන විටත් නිවැරදි කර නොතිබුණි.

- ❖ දොරවල් අගුළු ලා තිබීම හේතුවෙන් ඇතුළත පරීක්ෂා කිරීමට නොහැකි වූ අතර ඉංජිනේරු සංස්ථාවේ වැඩබිම් ඒකක ගලවා ඉවත් නොකිරීම හේතුවෙන් වැඩබිම තුළ ගබඩා දෙකක් පැවතුණි.
- ❖ භාරදීමෙන් පසු මෙතෙක් භාවිතයට නොගැනීම හේතුවෙන් ගොඩනැගිල්ල අවට වල් බිහිවී තිබුණි. ජනෙල් සඳහා ග්‍රිල් සවිකර නොතිබුණු අතර විනිවිද පෙනෙන වීදුරු සහිත ජනෙල් පියන් සවිකර තිබීම හේතුවෙන් එහි ආරක්ෂාව සැලසී නොතිබුණි.
- ❖ ජල සම්බන්ධතාවය සහ විදුලි සම්බන්ධතාවය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.
- ❖ වහලය වටා ගසා ඇති වඩිම්බු පටි ස්ථාන කිහිපයකින් ගැලවීගොස් තිබුණු අතර අත්තිවාරමින් ඉහල කොටසේ බැම්ම කිප ස්ථානයකින්ම ඉරිතලා ගොස් තිබුණි.
- ❖ බිත්තිය සහ වහලය අතර විශාල ප්‍රමාණයේ හිඩසක් සහිතව ඉදිකිරීම් කටයුතු සිදු කිරීම හේතුවෙන් පරීක්ෂා කරන අවස්ථාව වන විටත් පරවියන් ලැගුම්ගන්නා ස්ථානයක් බවට පත්ව තිබුණි. ජනෙල් රාමුවේ පියනට ඉහල කොටස (අඩි 2 1/2) තුළ ලී පටි සහිත බීරළු සවිකර තිබුණද බීරළු දෙකක් අතර පරතරය විශාල හෙයින් විවිධ සතුන්ට ගොඩනැගිල්ල තුළට පැමිණීමේ වැඩි හැකියාවක් පැවතුණි.

(iii) ව්‍යාපෘතියේ ඉතිරි අදියර 03 හි වැඩ ආරම්භ කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන සලසා ගැනීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීමට අපොහොසත්වී තිබුණි.

(iv) මෙම ගොඩනැගිල්ල ඉදිකර තිබුණු රෝහල් භූමියේ අයිතිය දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) මැදවච්චියේ වකුගඩු රෝහලක් ඉදිකිරීම

---------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2014 වර්ෂය මැදභාගයේ සිට දිස්ත්‍රික්ක ගණනාවක පැතිර පවතින වකුගඩු රෝග මුලිනුපුටා දැමීම සඳහා දේශීය වෛද්‍ය විද්‍යාව තුළින් ගතහැකි දායකත්වය ඉහළ නැංවීම අරමුණු කර ගෙන ඇඳන් 50 කින් යුක්ත රෝහලක් මැදවච්චියේ ඉදිකිරීමට තීරණය කර

තිබුණි. ඉංජිනේරු ඇස්තමේන්තුව රු.53,836,395 ක් වූ අතර මෙය කාලීන අවශ්‍යතාවයක් ලෙස සලකා 2014 වර්ෂයේදීම ඉදිකර අවසන් කිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව රාජ්‍ය අරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය වෙත පවරා තිබුණි. නමුත් රජයේ ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයේ 2.14.1 ඡේදය ප්‍රකාරව, ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරවීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ii) මෙම කොන්ත්‍රාත්තුවට අදාළ ප්‍රමාණපත්‍ර පිළියෙල කර නොතිබුණු අතර ගෙවීම් කිරීමට පෙර, කරන ලද වැඩ කොටස් ඇගැයීමට හා ඉංජිනේරු සහතිකයක් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) 2015 දෙසැම්බර් 31 දින වනවිට සමස්ත සංශෝධිත කොන්ත්‍රාත් පිරිවැය වූ රු.85,373,218 ක් ගෙවා අවසන්කර තිබුණද, 2017 දෙසැම්බර් 31 දින වන විටත් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.2 මාර්ගෝපදේශය ප්‍රකාරව පිරිවිතර හා එකඟවී ඇති වෙනත් නියම සහ කොන්දේසිවලට අනුකූලව වැඩ ඉටුකර ඇති බවට හා සහතික කර ඇති ගෙවීම්, කොන්ත්‍රාත් කොන්දේසිවලට අනුකූල බවට සහතික කරමින් වැඩ අවසන් කිරීමේ සහතිකයක් ලබා ගෙන නොතිබුණි.

(iv) මෙම රෝහල ඉදිකිරීම සඳහා රු.85,373,218 ක් වැයකර තිබුණද, ඉඩම දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) බොරැල්ල ආයුර්වේද රෝහලේ රසායනාගාර සේවාවන් අඩාලවීම

---

බොරැල්ල ආයුර්වේද ශික්ෂණ රෝහලේ රසායනාගාරයේ සවිකර තිබුණු වායු සමීකරණ යන්ත්‍ර දෙකින් එකක් සම්පූර්ණයෙන් අක්‍රියවී තිබුණු අතර ඉතිරි යන්ත්‍රය වරින්වර අක්‍රියවී පැවතුනි. එය රසායනාගාරයේ ස්ථාපිත මසකට full blood count පරීක්ෂණ 100ක් පමණ සිදුකළ හැකි Hematology Analyzer යන්ත්‍රයේ ක්‍රියාකාරීත්වය සඳහා සෘජු බලපෑමක් ඇතිකර තිබුණි. රෝගී සත්කාර සේවාවන් අඛණ්ඩව පවත්වා ගැනීමේ අරමුණින් 2018 මාර්තු 12 දින රු.400,000 ක් වැයකර වායු සමීකරණ යන්ත්‍ර 02 ක් එම රසායනාගාරයේ සවිකර තිබුණි. එසේ නමුත් මෙම වායුසමීකරණ සඳහා අවශ්‍ය තෙකලා විදුලිය සැපයුම ලබා ගෙන නොතිබීම හේතුවෙන් 2018 ජුනි 28 දින වන විටත් වායු සමීකරණ යන්ත්‍ර 02 ම ක්‍රියාත්මක කළ නොහැකිවීම නිසා full blood count පරීක්ෂණ සිදු කිරීම සම්පූර්ණයෙන් නවතා තිබුණි.

(ඊ) වායු සමීකරණ යන්ත්‍ර මනාව නඩත්තු නොකිරීම

---

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

(i) දෙපාර්තමේන්තුව හා ඒ යටතේ ඇති ආයතන සඳහා සමාලෝචිත වර්ෂයට පෙර මිලදී ගත් වායු සමීකරණ යන්ත්‍ර ප්‍රමාණය, එක් එක් වායුසමීකරණය ස්ථාපිත ස්ථානය හා එම යන්ත්‍ර පිළිබඳ අදාළ කිසිදු තොරතුරක් ලබා ගත හැකිවන පරිදි ලේඛන හෝ ලිපිගොනු නඩත්තු කර නොතිබුණි. එසේම වායු සමීකරණ යන්ත්‍ර සඳහා ලැබී තිබුණු නොමිලේ සේවා කිරීම්වලින් පසුව යන්ත්‍ර මනාව නඩත්තු කළ හැකි වන පරිදි සේවා ගිවිසුම්වලට එළඹීමටද කටයුතු කර නොතිබුණි.

(ii) බොරැල්ල ආයුර්වේද ශික්ෂණ රෝහලේ සවිකර තිබුණු අක්‍රියවී ඇති වායු සමීකරණ යන්ත්‍ර 21 ක් අළුත්වැඩියා කර දෙන ලෙසත්, ඉන් පසුව සේවා කර ගැනීමට අවශ්‍ය කටයුතු සළසා දෙන ලෙසත් දිගින් දිගටම ඉල්ලීම් කර තිබුණද, දෙපාර්තමේන්තුව විසින් ඒ පිළිබඳව ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණි. තවද 2017 දෙසැම්බර් 31 දින

වන විට රෝහලේ සවි කර තිබුණු වායු සමීකරණ යන්ත්‍ර 73 කින් 44 ක් ක්‍රියා විරහිත තත්ත්වයේද, 20 ක් සේවා කළයුතු තත්ත්වයේද, 3 ක් අර්ධ ලෙස ක්‍රියාත්මක තත්ත්වයේද පැවතුණි.

(උ) බොරැල්ල ආයුර්වේද ශික්ෂණ රෝහලේ අමු ඖෂධ කොන්ත්‍රාත්තුව

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂයේදී බොරැල්ල ආයුර්වේද ශික්ෂණ රෝහලට අවශ්‍ය අමු ඖෂධ වර්ග 416 කින් වර්ග 361 ක් සැපයීමේ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට 2017 මාර්තු 13 දින දක්වාම කල් ගතවී තිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ පළමු කාර්තුවට අවශ්‍ය අමු ඖෂධ ප්‍රමාණවත් පරිදි සපයා ගත නොහැකිවී තිබුණි. ඒ හේතුවෙන් ඉකුත් වර්ෂයේ අවසන් කාර්තුවට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ පළමු කාර්තුවේදී ක්වාථ, රස, චූර්ණ යන නිෂ්පාදනයන් පිළිවෙළින් සියයට 22 ක්, සියයට 54 ක් හා සියයට 27 ක් අඩු වී තිබුණි. එසේම වෙනත් ඖෂධ වර්ග 14 කින් මිලි ලීටර් 750 බෝතල් 600 ක් හා කිලෝ ග්‍රෑම් 231.25 ක ප්‍රමාණයන් පිටතින් මිලදී ගැනීම සඳහා රු.944,450 ක් වැය කිරීමට සිදුවී තිබුණි.

(ii) තෝරාගත් සැපයුම්කරුවන් දෙදෙනා වෙත පිළිවෙළින් රු.7,216,250 ක හා රු.6,677,000 ක කොන්ත්‍රාත් වටිනාකමක් සහිත කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබුණු නමුත් කොන්ත්‍රාත් වටිනාකම් ගිවිසුම්වලට ඇතුළත් කර නොතිබුණි.

(iii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.10 මාර්ගෝපදේශය ප්‍රකාරව, කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 10 කට නොඅඩු ප්‍රතිශතයක් කාර්යාසාධන සුරක්ෂණය ලෙස තබාගත යුතු වුවද, සැපයුම්කරුවන් දෙදෙනාගෙන් පිළිවෙළින් සියයට 1.5 හා සියයට 0.88 ක ප්‍රතිශතයකට සමාන වටිනාකම්වලින් පමණක් කාර්යසාධන සුරක්ෂණය ලබා ගෙන තිබුණි. ඒ අනුව පිළිවෙළින් රු. 613,381 ක් හා රු.608,942 ක් අඩුවෙන් කාර්යසාධන සුරක්ෂණය ලබාගෙන තිබුණි.

(ඌ) බොරැල්ල ආයුර්වේද ශික්ෂණ රෝහලේ ඖෂධ නිෂ්පාදනාගාරය හා ගබඩාකරණය ඖෂධාගාර නියෝගවලට පටහැනිව පවත්වා ගෙන යාම

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) බොරැල්ල ආයුර්වේද ශික්ෂණ රෝහලේ නිෂ්පාදනය කරන අරිෂ්ඨ ප්ලාස්ටික් කෑන්වල ගබඩාකර තිබීම ඒවායේ ගුණාත්මකභාවයට බලපෑමක් සිදු නොවේය යන්න තහවුරු නොකෙරුණි.

(ii) 2016 වර්ෂයේ සිට නිෂ්පාදනාගාරය පිටුපස මෙන්ම නිමි ඖෂධ ගබඩාව ඉදිරිපිට පිහිටි මළනළ පද්ධතියක් උතුරා දැඩි දුර්ගන්ධයක් වහනය වන බවත්, නිමි ඖෂධ ගබඩාවේ අරිෂ්ඨ අංශයේ විදුලි පද්ධතිය ක්‍රියාවිරහිතව පවතින බවත් අනාවරණය විය. එසේ වුවද 2018 ජූලි 31 දින වන විටත් මළනළ පද්ධතිය අළුත්වැඩියා කිරීමට හා විදුලි පද්ධතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

(එ) පාරම්පරික විශේෂ වෛද්‍යවරුන් ආයුර්වේද රෝහල් සඳහා ඵලදායීව යොදවා නොගැනීම

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) අක්ෂි රෝග, කැඩුම් බිඳුම්, දැවුම් පිළිස්සුම්, සර්ප විෂ, මානසික රෝග, ගෙඩිවන හා පිළිකා යනාදී වශයෙන් වූ රෝග සම්බන්ධයෙන් පාරම්පරික විශේෂ වෛද්‍යවරුන් 19 දෙනෙකු කොන්ත්‍රාත් පදනම බඳවා ගෙන ආයුර්වේද රෝහල් 06 ක් වෙත අනුයුක්ත කර සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 6.45 ක් දීමනා ලෙස ගෙවා තිබුණි. කෙසේ වුවද මෙම විශේෂ වෛද්‍යවරුන් බඳවා ගැනීමට ඇති අධිකාරී බලය, අනුමැතිය හා තෝරාගත් පදනම හා ඔවුන්ගේ පෞද්ගලික ලිපිගොනු විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

(ii) දේශීය වෛද්‍ය විද්‍යාලවල ශිෂ්‍යයින්ට ඉගැන්වීම සඳහා යොමු කරමින් ආයුර්වේද වෛද්‍ය සේවයට ප්‍රශංසනීය දායකත්වයක් මොවුන්ගෙන් ලබා ගැනීම අපේක්ෂාව වුවද, එම අරමුණු ඉටුකර ගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් හඳුනාගෙන නොතිබුණි.

(iii) බොරැල්ල ආයුර්වේද ශික්ෂණ රෝහල තුළ සිදු කළ ක්ෂේත්‍ර පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ පරිදි ඒ ඒ පාරම්පරික විශේෂඥ වෛද්‍යවරුන්ගේ තොරතුරු නාමපුවරු මගින් මහජනතාවට ප්‍රදර්ශනය නොකිරීම, මෙම වෛද්‍යවරුන් වෙත රෝගීන් යොමු කරන පදනම හඳුනාගෙන නොතිබීම, සායන සඳහා ප්‍රමාණවත් යටිතල පහසුකම් සලසා නොතිබීම, පාරම්පරික බෙහෙත් වට්ටෝරු මත ප්‍රතිකාර කිරීමට හැකි ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබීම යනාදී කරුණු හේතුවෙන් පාරම්පරික වෛද්‍ය ක්‍රම මහජනයා තුළ ප්‍රචලිත කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් හඳුනාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(iv) පාරම්පරික විශේෂ වෛද්‍යවරුන්ගේ ගුණාත්මක සේවාව වෙනුවෙන් දීමනා ගෙවනු ලැබුවද, ඔවුන්ගෙන් ප්‍රතිකාර ලබා ගැනීම සඳහා ඉදිරිපත් වන රෝගීන් ප්‍රමාණය අඩුවී තිබුණි. එම ගැටළුව විසඳීම සඳහා 2018 ජුනි 18 දින කමිටුවක් පත් කර තිබුණු නමුත් එම කමිටුව ඉටු කළ යුතු කාර්යභාර්යන් නිශ්චිතව සඳහන් කර නොතිබුණු අතර කමිටුව සඳහා නිශ්චිත කාල සීමාවක්ද ලබාදී නොතිබුණි.

(ඒ) අළුත්වැඩියා හා නඩත්තු කටයුතු නිසි ලෙස ඉටු නොවීම හේතුවෙන් ගාස්තු අයකරන කාමර වසා දමා තිබීම

---

බොරැල්ල ආයුර්වේද ශික්ෂණ රෝහලේ ගාස්තු අයකරන කාමර 20 කින් සමන්විත පංචකර්ම ගොඩනැගිල්ලේ වහල අබලන්ව පැවතුණි. එසේම සිවිලිමෙන් ජලය වැස්සීම හා ටයිල් ගැලවීම ආදී හේතූන් මත එම කාමර 03 ක් මාස 20 ක පමණ කාලයක සිට වසා දමා තිබුණි. එසේම දෙවන වාට්ටු ගොඩනැගිල්ලෙහි සනීපාරක්ෂක පහසුකම්වල අඩුපාඩු හා නල පද්ධති අක්‍රීය වීම හේතුවෙන් ගාස්තු අයකරන කාමර 02 ක් මාසයක පමණ කාලයක සිටද වසා දමා තිබුණි. මේ හේතුවෙන් රු.මිලියන 1.85 ක ආදායමක් අහිමි වී තිබුණු නමුත් සිදුකළ යුතු අළුත්වැඩියාවන් 2018 අගෝස්තු 30 දින වන විටත් සිදුකර නොතිබුණි.

(ඔ) 2017 වර්ෂයේ බොරැල්ල රෝහලේ පවිත්‍රතා සේවය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) රෝහලේ පවිත්‍රතා කාර්යයන් සඳහා දෙපාර්ශවය අතර එළඹි ගිවිසුමේ 02 ඡේදය ප්‍රකාරව, දෛනිකව වැඩ පරික්ෂකවරු 02 දෙනෙකු හා කම්කරුවන් 34 ක් පවිත්‍රතා කාර්යය සඳහා යොදාගත යුතු විය. ඊට පටහැනිව 2017 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලය තුළ වැඩ පරීක්ෂණවරු සේවය කළ යුතු නියමිත දින ගණනට වඩා දින 119 ක් අඩුවෙන්ද, කම්කරුවන් සේවය කළයුතු දින ගණනින් දින 915 ක් අඩුවෙන්ද සේවය ලබාදී තිබුණි.

(ii) පවිත්‍රතා කොන්ත්‍රාත් කාර්යයට අදාළ උපකරණ හා විෂබීජනාශක සඳහා මාසිකව රු.190,335 ක් වෙන්කර තිබුණි. එසේ වුවද මාසිකව රෝහල වෙත රැගෙන එන උපකරණ හා විෂබීජනාශක ප්‍රමාණය හෝ එම ද්‍රව්‍ය නියමිත මාත්‍රාවෙන් යොදන්නේද යන්න පිළිබඳ රෝහලේ කිසිදු නිලධාරියෙකුගේ අධීක්ෂණයක් හෝ නිවැරදි බවට සහතික කිරීමක් සිදුකර නොතිබුණි.

(iii) පවිත්‍රතා සේවය සපයන ආයතනය වෙතින් මාසිකව කොපමණ විෂබීජ නාශක ද්‍රව්‍ය හා උපකරණ ලැබෙන්නේද යන්න තහවුරු කිරීමට විධිමත් ලේඛනයක් හෝ ගොනුකළ බිල්පත්, වැඩ පරීක්ෂක සතුව නොතිබුණි. වැඩ පරික්ෂක විසින් තහවුරු කළ පරිදි සාමාන්‍යයෙන් මාසකට රු.45,000 ක් පමණ වටිනා ද්‍රව්‍ය යොදා ගන්නා නමුත් මාසයකට රු.190,335 ක් බැගින් ගෙවා තිබුණු බැවින් 2017 ජනවාරි සිට 2017 අප්‍රේල් දක්වා කාලය තුළදී විෂබිජ නාශක ද්‍රව්‍ය සඳහා රු.581,340 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඕ) ආයුර්වේද සමීක්ෂාව පොතේ දෙවන වෙළුම මුද්‍රණය කිරීම

ආයුර්වේද දැනුම සංරක්ෂණය කිරීම අරමුණු කර ගෙන සංස්කරණ මණ්ඩලය වෙත දීමනා සඳහා හා සංග්‍රහ වියදම් වෙනුවෙන් 2017 හා 2018 වර්ෂවලදී පිළිවෙලින් රු.253,250 ක් හා රු.1,446,750 ක් වැයකර ආයුර්වේද සමීක්ෂාව පොතෙහි පිටපත් 750 ක් මුද්‍රණය කර තිබුණු අතර එම පොත් 2018 මැයි 03 දින දෙපාර්තමේන්තුව වෙත ලැබී තිබුණි. එම පිටපත් 750 2018 අගෝස්තු 31 දින වන විටත් අලෙවිය සඳහා නිකුත් කර නොතිබුණි. තවද 1998 වර්ෂයේ සිට 2003 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදය තුළදී මුද්‍රණය කරන ලද ආයුර්වේද සමීක්ෂාව පොත් 831 ක් හා 2005 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී මුද්‍රණය කරන ලද ආයුර්වේද සමීක්ෂාව පොත් 1,271 ක් 2018 අගෝස්තු 31 දින වන විට නොවිකිණී ඉතිරිව පැවතුණි.

**(ක)** ආයුර්වේද ආයතන ලියාපදිංචි කිරීම හා වාර්ෂිකව බලපත්‍ර අළුත් කිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 10 වන වගන්තිය ප්‍රකාරව, ආයුර්වේද ආරෝග්‍යශාලා, ඖෂධ නිෂ්පාදනාගාර, ඖෂධශාලා හා බෙහෙත් ගබඩා වෙතින් ලියාපදිංචිවීම සඳහා ඉදිරිපත් කරන අයදුම්පත් පිළිබඳව කටයුතු කිරීමේ ප්‍රමාදයක් පැවති අතර 2018 මාර්තු 08 දින වන විට එසේ ලැබී තිබුණු අයදුම්පත් 2,500 ක් සම්බන්ධයෙන් ලියාපදිංචි කටයුතු අවසන් කර නොතිබුණි.

(ii) 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 10 වගන්තිය ප්‍රකාරව, ආයුර්වේද කොමසාරිස්වරයා වෙත පැවරී තිබෙන වගකීම් හා බලතල නියෝජ්‍ය හෝ සහකාර ආයුර්වේද කොමසාරිස්වරු වෙත පමණක් පැවරිය හැකිව තිබුණි. කෙසේ නමුත් එම

වගකීම් හා බලතල පළාත් ආයුර්වේද කොමසාරිස්වරුන්ට හා ඔහු විසින් නම් කරනු ලබන නිලධාරීන් වෙත පවරා තිබුණි.

(iii) ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇති ආයුර්වේද ප්‍රතිකාර මධ්‍යස්ථාන, පංචකර්ම ආයතන, හෝටල්තුළ පංචකර්ම ආයතන, පෞද්ගලික ආයුර්වේද රෝහල්, නිෂ්පාදනාගාර, වෙළඳසැල් සම්බන්ධයෙන් හා ආනයනික ඖෂධ සඳහා නව ලියාපදිංචි කිරීම් හා ඒවා අළුත් කිරීම් සම්බන්ධයෙන් පවත්වාගෙන යනු ලබන පරිගණක දත්ත පද්ධතිය යාවත්කාලීන කර විධිමත්ව පවත්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ග) ආයුර්වේද නීති සංග්‍රහයක් පිළියෙල කර නොතිබීම

---

1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 77 වගන්තිය ප්‍රකාරව, ආයුර්වේද වෛද්‍ය කර්මයේ හා ශල්‍ය වෛද්‍ය විද්‍යාවේ කාර්යයන් සඳහා යම් භාණ්ඩයක්, ද්‍රව්‍යයක් හෝ ඖෂධයක් නිෂ්පාදනය කිරීම, විකිණීම, සැපයීම, බෙදා හැරීම හෝ පිළියෙල කිරීම තහනම් කිරීමට, විධිමත් කිරීමට හෝ පාලනය කිරීමට අවශ්‍ය සියළු විධිවිධාන ඇතුළත් නීති සංග්‍රහයක් පිළියෙල කළ හැකිය. මේ සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ අංක 266/2012, අංක 284/2012 හා අංක 26/2017 දරන නඩු හා අභියාචනාධිකරණයේ අංක 107/2010 දරන නඩු තීන්දු මගින් නීති සංග්‍රහයක් පිළියෙල කර ප්‍රකාශයට පත් කරන ලෙස නියෝග පනවා තිබුණි. එසේ වුවද මෙම වාර්තාවේ දිනය වන විටත් නීති සංග්‍රහය පිළියෙල කර නොතිබුණි.

(ඝ) ආයුර්වේද ශික්ෂණ රෝහල් හා ආයුර්වේද පර්යේෂණ රෝහල් ස්ථාපිත කිරීම

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 7 වන වගන්තියේ දක්වා ඇති පරමාර්ථ ඉෂ්ඨ කිරීම සඳහා පනතේ 08 වන වගන්තිය මගින් ආයුර්වේද කොමසාරිස්වරයාට, ආයුර්වේද ආරෝග්‍යශාලා හා ඊට අනුබද්ධ ආයතන පිහිටුවා පවත්වාගෙන යාමට බලතල පවරා තිබුණි. එසේ වුවද, පළාත් සභා හා පළාත් පාලන ආයතන සහ මධ්‍යම රජය විසින් ස්ථාපිත කරන ලද ආයුර්වේද ආරෝග්‍යශාලා හා ඊට අනුබද්ධ ආයතනවල පිහිටීම සලකා බලා නව ආරෝග්‍යශාලා හා ඊට අනුබද්ධ ආයතන පිහිටුවීමට වඩාත් සුදුසු ප්‍රදේශයන් හඳුනාගැනීමට හා සැලැසුම් පිළියෙල කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) 1962 වර්ෂයේ නාවින්න ආයුර්වේද පර්යේෂණ රෝහල ස්ථාපිත කර ඉන් පසුව 2017 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී තවත් ආයුර්වේද පර්යේෂණ රෝහල් 04 ක් ස්ථාපිත කර තිබුණි. කෙසේ වුවද, එම රෝහල්වලින් රෝග පිළිබඳව පර්යේෂණ සිදු කරන බවට හෝ සිදුකරන ලද පර්යේෂණවලින් ලද නව සොයා ගැනීම් පිළිබඳව හෝ සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

(ඞ) ඖෂධ නිෂ්පාදනය සඳහා දේශීය සැපයුම්කරුවන්ගෙන් අමු හා වියළි ඖෂධ මිලදී ගැනීමට සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 34.73 ක් වැය කර තිබුණි. නමුත් දෙපාර්තමේන්තු ඔසු උයන්වලින් එම අවශ්‍යතාවය සම්පාදනය කර ගැනීමේ විධිමත් හා ක්‍රමවත් වැඩපිළිවෙලක් හඳුනාගෙන නොතිබුණි.

(ඩ) ගිරාදුරුකෝට්ටේ ඔසු උයනේ අක්කර 178 ක භූමි ප්‍රමාණයෙන් අක්කර 103 ක් පමණක් වගා කර තිබුණු නමුත් ඉතිරි අක්කර 75 වගා කිරීමට විධිමත් හා ක්‍රමවත් වැඩපිළිවෙලක් හඳුනාගෙන නොතිබුණි.

(න) ඔසු උයන් 6 ක වගාවන් සිදුකර ඇති අක්කර 223 ක් වූ භූමි ප්‍රමාණයේ කෙටිකාලීන ඖෂධීය ශාක යටි වගාවක් ලෙස ආරම්භ කිරීමට ඇති හැකියාවන් හඳුනාගෙන නොතිබුණි.

## 2.8 මහජනයා වෙත සේවා ඉටු කිරීම

පහත සඳහන් ක්ෂේත්‍රයන් පිළිබඳව අවධානය යොමු කර දෙපාර්තමේන්තුව විසින් ඉටු කළ යුතුව තිබුණු සේවා ඉටුකර නොමැති අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) වෙබ් අඩවිය යාවත්කාලීනව පවත්වා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) දෙපාර්තමේන්තුවේ ආයතන අංශයට දෙපාර්තමේන්තු වෙබ් අඩවිය පවත්වාගෙන යාමේ කාර්යයද, ශිල්පීය අංශයට භාවිතා කරන ආකෘතිපත්‍ර භාෂාත්‍රයෙන් වෙබ් අඩවියට ඇතුළත් කිරීම හා ඒවා යාවත්කාලීන කිරීමේ කාර්යයද පවරා තිබුණි. එසේ නමුත් දෙපාර්තමේන්තු වෙබ් අඩවිය යාවත්කාලීනව පවත්වා නොතිබුණු අතර සියළු තොරතුරු භාෂාත්‍රයෙන් ඇතුළත් කිරීම වෙනුවට බෙහෝමයක් තොරතුරු ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් ඇතුළත් කර තිබුණි.

(ii) දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන උප ආයතන හා සියළු රෝහල්වලින් ඉටුවන කාර්යයන් හා ඒ ඒ රෝහල මගින් පවත්වාගෙන යන සායනයන් හා ඊට අදාළ දිනයන්, අනෙකුත් ප්‍රතිකාර ක්‍රම, ජංගම සායන යනාදී වශයෙන් වූ සියළු සේවා තොරතුරු වෙබ් අඩවියට ඇතුළත් කර නොතිබුණි.

(ආ) තොරතුරු දැනගැනීමේ පනත ප්‍රකාරව කටයුතු කිරීමේ ප්‍රගතිය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2018 මාර්තු මාසය වන විට දෙපාර්තමේන්තුව විසින් දෙපාර්තමේන්තුවේ හා උප කාර්යාලවල තොරතුරු දැනගැනීමට නිලධාරීන් පත්කර තිබුණි. එසේ නමුත් මහජනයාගේ තොරතුරු දැනගැනීමේ අවශ්‍යතාවයන් සටහන්වීම හා එම අවශ්‍යතාවයන්ට ප්‍රතිචාර දැක්වීම පිළිබඳව හා මහජනතාව විසින් ඉදිරිපත් කරන පැමිණිලි සඳහා අප්‍රමාදව පිළියම් යොදන බව යනාදී වශයෙන් ඊට අදාළව සිදු කරන කාර්යයන් ලේඛනගත කර නොතිබුණි.

(ii) දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය තුළින් තොරතුරු දැනගැනීමේ පනතට දෙපාර්තමේන්තුව කටයුතු කරන ආකාරය පිළිබඳව අවශ්‍ය දැනුවත් කිරීම් හා වෙබ් අඩවිය මගින්ම මහජන පැමිණිලි ලබාගැනීමේ ක්‍රමවේදයක් පිළියෙල කර නොතිබුණි.

## 2.9 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය<br>රු.මිලියන | උපයෝජනය<br>රු.මිලියන | ඉතිරිය<br>රු.මිලියන | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| 2013 | පුනරාවර්තන | 721.25 | 636.57 | 84.68 | 11.74 |
| | මූලධන | 575.72 | 124.75 | 450.97 | 78.33 |
| | **එකතුව** | **1,296.97** | **761.32** | **535.65** | **41.30** |
| 2014 | පුනරාවර්තන | 848.82 | 821.14 | 27.68 | 3.26 |
| | මූලධන | 498.69 | 357.98 | 140.70 | 28.21 |
| | **එකතුව** | **1,347.51** | **1,179.12** | **168.38** | **12.50** |
| 2015 | පුනරාවර්තන | 1,166.97 | 1,109.01 | 57.95 | 4.97 |
| | මූලධන | 575.00 | 413.01 | 161.99 | 28.17 |
| | **එකතුව** | **1,741.97** | **1,522.02** | **219.94** | **12.63** |
| 2016 | පුනරාවර්තන | 1,272.50 | 1,239.52 | 32.98 | 2.59 |
| | මූලධන | 1,300.60 | 612.89 | 687.70 | 52.88 |
| | **එකතුව** | **2,573.10** | **1,852.41** | **720.68** | **28.01** |
| 2017 | පුනරාවර්තන | 1,267.76 | 1,238.26 | 29.49 | 2.33 |
| | මූලධන | 1,122.46 | 538.90 | 583.56 | 51.99 |
| | **එකතුව** | **2,390.22** | **1,777.16** | **613.05** | **25.65** |

**විසර්ජන ගිණුම**

**අධි ප්‍රතිපාදන සැලසීම**

අධි ඇස්තමේන්තු පිළියෙල කර තිබීම හා කළමනාකරණ අකාර්යක්ෂමතාවය හේතුවෙන් මූලධන වැය විෂයයන් 10 ක් සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 524.18 කින් රු.මිලියන 467.78 ක් ඉතිරිවී තිබුණු අතර එය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 55 ත් සියයට 98 ත් අතර පරාසයක විය.

## 2.10 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 22001 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 50 | 48.76 | 33 | 38 | 190 | 87 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

හිඟ හිටි ණය ශේෂ අයකර නොගැනීම

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව, එදිනට ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ හැර අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.මිලියන 2.10 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 05 ක් ඉක්මවූ කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි.

## 2.11 අග්‍රිම ගිණුම

සමාලෝචිත වර්ෂය සඳහා දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කර තිබුණු අග්‍රිම ඇස්තමේන්තුව අනුව මාසිකව ලබා ගැනීමට අපේක්ෂා කළ අග්‍රිමයන්, මාසිකව ඉල්ලුම්කළ අග්‍රිමයන් හා ලැබී තිබුණු අග්‍රිමයන් පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

| මාසය | සැලැසුම් කළ පරිදි ඉල්ලුම් කළ යුතු අග්‍රිමය | ඉල්ලුම් කළ අග්‍රිමය | ලැබී තිබුණු අග්‍රිමය | සැලැසුම් කළ පරිදි ඉල්ලුම් කළ අග්‍රිමය අතර වෙනස | ඉල්ලුම් කළ අග්‍රිමය හා ලැබී තිබුණු අග්‍රිමය අතර වෙනස |
|---|---|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| ජනවාරි | 208.34 | 212.23 | 185.71 | (3.89) | 26.52 |
| පෙබරවාරි | 205.19 | 100.27 | 159.74 | 104.92 | (59.48) |
| මාර්තු | 108.93 | 108.88 | 91.08 | 0.05 | 17.80 |
| අප්‍රේල් | 120.93 | 145.23 | 128.36 | (24.30) | 16.87 |
| මැයි | 108.53 | 129.82 | 105.96 | (21.29) | 23.86 |
| ජූනි | 116.23 | 140.82 | 108.72 | (24.59) | 32.10 |
| ජූලි | 129.63 | 183.70 | 145.32 | (54.07) | 38.38 |
| අගෝස්තු | 126.33 | 182.11 | 121.49 | (55.78) | 60.62 |
| සැප්තැම්බර් | 174.13 | 173.97 | 103.82 | 0.16 | 70.15 |
| ඔක්තෝබර් | 185.43 | 287.70 | 122.32 | (102.27) | 165.38 |
| නොවැම්බර් | 243.08 | 297.01 | 174.49 | (53.93) | 122.52 |
| දෙසැම්බර් | 228.83 | 642.91 | 268.80 | (414.08) | 374.11 |
| එකතුව | 1,955.58 | 2,604.65 | 1,715.81 | 648.48 | 888.23 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 371 (2) (ආ) ප්‍රකාරව, කිසියම් විශේෂිත කාර්යයක් සඳහා ලබාගත් තත්ත්කාර්ය අතුරු අග්‍රිමය එම කාර්යය නිමකල විගසම පියවිය යුතු වුවද, අවස්ථා 18 කදී ලබාගෙන තිබුණු එකතුව රු.864,064 ක් වූ අත්තිකාරම් කාර්යය නිමකළ දින සිට දින 16 ත් දින 148 ත් අතර කාලයක් ප්‍රමාදවී පියවා තිබුණි.

(ආ) 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371(2) හි සඳහන් විධිවිධානයන්ට පටහැනිව, 2017 වර්ෂය තුළදී මාණ්ඩලික නොවන නිලධාරීන් 33 දෙනෙකු වෙත අවස්ථා 182 කදී තත්ත්කාර්ය අතුරු අග්‍රිම රු.මිලියන 3.21 ක් නිකුත් කර තිබුණු අතර එයින් රු.මිලියන 2.46 ක් වැය කර තිබුණි.

(ඇ) නිසි පරිදි පිළියෙල කරන ලද ඇස්තමේන්තුවකින් තොරව සමාලෝචිත වර්ෂයේදී අවස්ථා 458 කදී රු.මිලියන 13 ක තත්ත්කාර්ය අතුරු අග්‍රිම නිකුත්කර තිබුණු අතර ඉන් රු.මිලියන 10 ක් පමණක් වියදම් කර තිබුණි.

(ඈ) 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371(2) (ආ) ප්‍රකාරව, කිසියම් විශේෂිත වූ කාර්යයක් සඳහා රු.100,000 ක් වූ මූල්‍ය සීමාව තුළ තත්ත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කළ හැකි වුවද, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව රු.100,000 සීමාව ඉක්මවූ කාර්යයන් සඳහා අවස්ථා 04 කදී රු.1,176,250 ක් නිලධාරීන් 12 දෙනෙකු වෙත නිකුත් කර තිබුණි.

## 2.12 පොදු තැන්පත් ගිණුම

දෙපාර්තමේන්තුව යටතේ වන පොදු තැන්පත් ගිණුම් 05 ක 2017 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 81.23 ක් විය. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 2 ක් ඉක්මවූ (ඉඩම් තැන්පතු හැර) එකතුව රු.324,791 ක්වූ තැන්පතු 12ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) බොරැල්ල ආයුර්වේද රෝහලේ ගෙවන වාට්ටුවල ප්‍රතිකාර ලබන රෝගීන්ගෙන් අයකරන තැන්පත් මුදල්, ඔවුන් රෝහලෙන් පිටව යන අවස්ථාවේදීම බිල්පත් වටිනාකමට හිලව් කිරීම සඳහා විධිමත් හා නිශ්චිත වැඩපිළිවෙලක් හඳුනාගෙන ක්‍රියාත්මක කර නොතිබුණි. ඒ හේතුවෙන් 2016 ජූලි 01 දින සිට 2016 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුළදී ගෙවන වාට්ටුවට ඇතුළත්වී තිබුණු රෝගීන් 153 දෙනෙකුගෙන් ලබාගෙන තිබුණු තැන්පතු මුදල්රු.1,396,840 ක් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන එම මුදල් 2017 දෙසැම්බර් 14 දින රාජ්‍ය ආදායමට බැරකර තිබුණි. එසේම 2017 වර්ෂයේදී රෝගීන්ගෙන් අයකර තිබුණු තැන්පත් මුදල් රු.3,757,500 ක් බිල්පත්වලට හිලව් නොකර 2018 ජුනි 07 දින වන විටත් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

## 2.13 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණය |
| --- | --- | --- |
| (අ) ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 502(2) | යාවත්කාලීනව පවත්වා නොතිබුණි. |
| (ආ) විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454 (2) | පවත්වා නොතිබුණි. |
| (ඇ) රජයේ නිලධාරීන්ගේ ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891 | පවත්වා නොතිබුණි. |
| (ඈ) පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිජ්අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීනව පවත්වා නොතිබුණි. |
| (ඉ) ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණික ඇගැයීම් කමිටුවල පැමිණීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය | පවත්වා නොතිබුණි. |
| (ඊ) ප්‍රසම්පාදන කමිටු හා තාක්ෂණික ඇගැයීම් කමිටු රැස්වීම් වාර්තා | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.3(අ) මාර්ගෝපදේශය | පවත්වා නොතිබුණි. |

## 2.14 අනුකූල නොවීම්

### 2.14.1 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීතිරීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථාවක් පහතින් විග්‍රහ කර දැක්වේ.

| | නීතිරීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
| --- | --- | --- | --- |
| | | රු. | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | |
| | ආයතන සංග්‍රහයේ XIV පරිච්ඡේදය | 1,073,333 | දෙපාර්තමේන්තුවේ රාජකාරි සඳහා ගමන් බිමන් යන නිලධාරීන්ට යැපීම් හා නවාතැන් පිළිබඳ සංයුක්ත දීමනාව ගෙවීම වෙනුවට හෝටල් හා නවාතැන් ගාස්තු ප්‍රතිපූර්ණය කර තිබුණි. |

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

--------------------------------------------

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 102 සිට 109 | 158,000 | අනතුරකට පත්වී තිබුණු වාහනයක් අළුත්වැඩියා කිරීම සඳහා රු.158,000 ක් වැය කර තිබුණු නමුත් අනතුරට වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන නොතිබුණි. |

## 2.15 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රෝහල් 08 ක්, ආයුර්වේද පර්යේෂණායතනය හා නාවින්න පර්යේෂණ රෝහල, දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය හා ඔසු උයන් 06 කින් සමන්විත සමස්ත දෙපාර්තමේන්තුවේද, ආයුර්වේද වෛද්‍ය සභාවේද ගිණුම් හා ගනුදෙනු විගණනය සඳහා ප්‍රධාන අභ්‍යන්තර විගණක සමග තවත් නිලධාරීන් දෙදෙනෙකු පමණක් අනුයුක්ත කර තිබුණි. එසේම එම නිලධාරීන් දෙදෙනා සෑම වර්ෂයකම ජනවාරි සිට අගෝස්තු දක්වා කාලපරිච්ඡේදය තුළ භාණ්ඩ සමීක්ෂණ රාජකාරි කටයුතු හා ඔසුපැන් ලබාදීමේ විවිධ වැඩසටහන් සඳහා අනුයුක්ත කර තිබුණි. මේ හේතුවෙන් මුදල් රෙගුලාසි 134(1) ප්‍රකාරව, පිහිටුවා ඇති අභ්‍යන්තර විගණන ඒකකයේ ස්වාධීනත්වය තහවුරු වී නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 134 (2) ප්‍රකාරව, අභ්‍යන්තර විගණන වැඩසටහනක් පිළියෙල කර තිබුණද, සමාලෝචිත වර්ෂයේදී විගණන වැඩසටහනේ දැක්වෙන ප්‍රධාන කාර්යයන් 25 ක් අතරින් කාර්යයන් 18 ක් ඉටුකර නොතිබුණි.

## 2.16 මානව සම්පත් කළමනාකරණය

### 2.16.1 අනුමත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම

දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු.මිලියන 958.97 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු.695,412 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 653 | 568 | 85 |
| (ii) | තෘතියික මට්ටම | 46 | 07 | 39 |

| | | | | |
|---|---|---|---|---|
| (iii) | ද්විතියික මට්ටම | 451 | 249 | 202 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 776 | 555 | 221 |
| | **එකතුව** | **1926** | **1,379** | **547** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අවශ්‍යතාවය ඉක්මවා කාර්ය මණ්ඩලය අනුමත කරවා ගැනීම

---

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 547ක් තිබුණත්, 2017 වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණු විසර්ජන ගිණුම අනුව සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකර ඉතිරි වී තිබුණත්, පහත සඳහන් අවස්ථාවලදී හැර එම ඉතිරියන් කෙරෙහි කාර්ය මණ්ඩල පුරප්පාඩු පැවැතීම බලපා නොතිබුණි. ඒ අනුව අනුමත කාර්ය මණ්ඩලය අධි ඇස්තමේන්තු කිරීමක් සිදු වී තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

(i) දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් අතර වූ සම්මන්ත්‍රණ, අධ්‍යාපන පන්ති හා ආයුර්වේදය පිළිබඳ පාඨමාලා පැවැත්වීමේ කාර්යයන් ඉටුකර ගැනීම සඳහා පිහිටුවා තිබුණු දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනයේ (NITM) ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 16 ක් අතරින් නියෝජ්‍ය අධ්‍යක්ෂ (සාමාන්‍ය) හා නියෝජ්‍ය අධ්‍යක්ෂ (තාක්ෂණ අධ්‍යාපන) යන ප්‍රධාන තනතුරු 02 ක් හා අනුමත රාජ්‍ය කළමණාකාර සහකාර තනතුරු 08 ක් අතරින් තනතුරු 04 ක් පුරප්පාඩුව පැවතුණි.

(ii) දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් අතර වූ දේශීය වෛද්‍ය ක්‍රමය නඟා සිටුවීමට අදාළ පර්යේෂණ කටයුතු ඉටු කිරීම සඳහා ස්ථාපිත බණ්ඩාරණායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනයේ කාර්යයන් ඉටු කරගැනීමට සෘජුවම දායකත්වය ලබා ගතයුතු, විද්‍යාඥ තනතුරු 02 ක්, විශේෂඥ වෛද්‍ය නිලධාරී තනතුරු 08 ක්, විශේෂ වෛද්‍ය නිලධාරී තනතුරු 05 ක් හා විද්‍යාත්මක නිලධාරී තනතුරු 08 ක් ඇතුළු ජ්‍යෙෂ්ඨ මට්ටමේ අනුමත තනතුරු 67 කින් තනතුරු 24 ක්ද, පර්යේෂණ නිලධාරීන් 18 දෙනෙකු ඇතුළු තෘතියික මට්ටමේ අනුමත තනතුරු 23 කින් තනතුරු 22 ක්ද, වෛද්‍ය පර්යේෂණ ශිල්පී තනතුරු 03 ක්, තාක්ෂණ නිලධාරී තනතුරු 14 ක් හා පර්යේෂණ සහකාර තනතුරු 05 ක් ඇතුළු ද්විතීයික මට්ටමේ අනුමත තනතුරු 84 කින් තනතුරු 45 ක්ද පුරප්පාඩුව පැවතුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුව යටතේ ඇති රෝහල් 9 ක අත්‍යාවශ්‍ය තනතුරු 9 ක අනුමත සේවක සංඛ්‍යාව 976 ක් වූ නමුත් තත්‍ය සේවක සංඛ්‍යාව 689 ක් විය.

(ඇ) කාර්ය මණ්ඩලය පුහුණු කිරීම

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) දෙපාර්තමේන්තුවට අනුයුක්ත කාර්යය මණ්ඩලය වර්ෂය තුළදී පුහුණු කිරීම සම්බන්ධයෙන් පුහුණු කිරීමේ සැලැස්මක් පිළියෙල කර නොතිබුණු අතර වාර්ෂිකව නිලධාරීන්ට පුහුණු පැය ගණනක් නිශ්චිත කර ඒ අනුව වාර්ෂිකව නිලධාරීන්ගේ කාර්යසාධනය මැනීමට සුදුසු වැඩපිළිවෙලක්ද පිළියෙලකර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය තුළදී දෙපාර්තමේන්තුවට අනුයුක්ත 1,379 ක් වූ මුළු කාර්යය මණ්ඩලයෙන් 19 දෙනෙකු සඳහා පමණක් රු.319,225 ක් වැය කර පුහුණුවීම් ලබාදී තිබුණු අතර විදේශ පුහුණුවීම් හා ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතේ පවතින උප

ආයතනවල සේවයේ නියුක්ත නිලධාරීන්ගේ පුහුණුවීම් පිළිබඳ සියළු තොරතුරු පවත්වා නොතිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේ පුහුණු කිරීම් සඳහා වෙන්කර තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 89 ක් හෙවත් රු.3,153,000 ක් වැයකර, දෙපාර්තමේන්තුවේ වෛද්‍ය නිලධාරීන් 538 දෙනෙකු අතරින් වෛද්‍ය නිලධාරීන් 34 දෙනෙකු පශ්වාද් උපාධි පාඨමාලා සඳහා සහභාගී කරවා තිබුණි. කෙසේ වුවද ඒ සඳහා ඔවුන් 34 දෙනා තෝරා ගත් ක්‍රමවේදය විගණනයට ඉදිරිපත් නොකෙරුණි. පුහුණු වැය විෂය යටතේ සෑම මට්ටමකම නිලධාරීන් සඳහා විෂමතාවයකින් තොරව පුහුණු වීම් ලැබෙන පරිදි සුදුසු පුහුණු සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**2.17 රජයේ නිලධාරීන් ඇප තැබීම**

**----------------------------------**

මුදල් රෙගුලාසි 880 හි සඳහන් විධිවිධාන ප්‍රකාරව, ඇප තැබිය යුතු නිලධාරීන් විසින් ඇප තබා ඇති බව තහවුරු නොකෙරුණු අතර මුදල් රෙගුලාසි 891 හි සඳහන් විධිවිධාන ප්‍රකාරව, ඇප අවශ්‍ය සියළුම නිලධාරීන්ගේ නම් ඇතුළත් ඇප ලේඛනයක් නඩත්තු කර නොතිබුණි.